

වාර්ෂික වාර්තාව

2024

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ 1

2 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC) 1

3 විගණන සහ කළමනාකරණ කමිටු සංයුතිය (AMC) 2

4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර 3

5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල විස්තර 4

5.1 2024 දෙසැම්බර් මස 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල සිවිල් කාර්යය මණ්ඩලය 4

5.2 2024 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලය 5

5.3 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 5

6 විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යය භාර්යය 6

6.1 ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණකගේ වාර්තාව 7

7 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ හැඳින්වීම 9

7.1 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව 9

7.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා 10

7.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් 11

7.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් 11

7.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය 13

8 2024 වර්ෂයේ දී තාක්ෂණික අංශවල ප්‍රගතිය 14

8.1 පෙර සූදානම් හා සැලසුම් අංශය 14

8.1.1 දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද පෙර සූදානම් වැඩසටහන් 14

8.1.2 නිරිතදිග මෝසම් හා ඊසානදිග මෝසම් පිළිබඳ ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන 15

8.1.3 ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය හා ස්වාභාවික ව්‍යසන සඳහා කාර්යක්ෂම ආපදා කළමනාකරණය 16

8.1.4 ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්දායි ක්‍රියාකාරී රාමුවට අදාළව ජාතික හා ප්‍රාදේශීය උපාය මාර්ග ක්‍රියාවට නැංවීම (LDRR) 16

8.1.5 විභාග කාලසීමාව තුළ ආපදා හේතුවෙන් ඇතිවිය හැකි බාධා වළක්වා ගැනීම සඳහා වැඩපිළිවෙළක් (පහ ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අ.පො.ස (සා/පෙළ), අ.පො.ස (උ/පෙළ)) 18

8.1.6 “ From Tragedy to Resilience : Reflections over two decades, Retrospect the 2004 Indian Ocean Tsunami” ජාතික සම්මන්ත්‍රණය 18

8.1.7 වෙනත් පෙර සූදානම් වැඩසටහන් 19

8.2	පුහුණු හා දැනුවත් කිරීමේ අංශය	**20**
8.2.1	ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	**20**
8.2.2	ආපදා සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමේ පුහුණු මෙවලම් සකස් කිරීම	**23**
8.2.3	**CBRNE** ජාතික සම්බන්ධීකරණ වැඩසටහන	**23**
8.2.4	එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පැවැත්වූ කලාපීය හවුල්කරුවන්ගේ පෙර සූදානම් වැඩමුළුව	**24**
8.2.5	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය යාවත්කාලීන කිරීම	**25**
8.2.6	ජාතික සුරක්ෂිත දින වැඩසටහන	**26**
8.2.7	දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	**28**
8.2.8	රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, නාෂ්ටික සහ ස්ඵෝටන **(CBRNE)** උපද්‍රව සම්බන්ධව දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ වැඩසටහන	**31**
8.2.9	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත් මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම	**32**
8.2.10	කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්	**32**
8.2.11	විදේශීය ධාරිතා වර්ධන වැඩසටහන්	**33**
8.3	හදිසි මෙහෙයුම් අංශය **(Emergency Operation Division)**	**34**
8.3.1	ආපදා සාරාංශය - **2024**	**35**
8.3.2	ප්‍රධාන ආපදා කිහිපයක **2023** සහ **2024** වර්ෂවල සාරාංශය	**35**
8.3.3	හදිසි මෙහෙයුම් අංශය හා ත්‍රිවිධ හමුදා සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සම්බන්ධීකරණයෙන් සිදුකරන ලද කටයුතු	**37**
8.3.4	**CResMPA** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	**39**
8.3.5	හදිසි මෙහෙයුම් මැදිරි නිරීක්ෂණය	**40**
8.3.6	පූර්ව දැනුම් දීම්	**40**
8.3.7	ඇමතුම් මැදිරිය	**41**
8.3.8	ප්‍රසම්පාදන	**42**
8.4	අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය	**43**
8.4.1	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	**43**
8.4.2	ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහනය කිරීම - නාගරික සංවර්ධනය ක්ෂේත්‍රය	**45**
8.4.3	ආපදා අවදානම් තක්සේරුව	**45**
8.4.4	චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම	**48**
8.4.5	**MODIS** චන්ද්‍රිකා දත්ත භාවිතයෙන් නියඟය නිරීක්ෂණය කිරීම	**49**

8.4.6	විවිධ පාර්ශව වෙත දත්ත ලබා දීම හා සිතියම් නිර්මාණය කිරීම	**49**
8.4.7	**Desinventar** සහ **RiskInfo** දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම	**50**
8.4.8	දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා හා කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	**52**
8.4.9	ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම	**52**
8.4.10	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සි **(JICA)** සහය ඇතිව, කැළණි ගංගා ද්‍රෝණිය තුල ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය යාන්ත්‍රනය තුලට අන්තර්ග්‍රහණය කිරීමේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය	**54**
8.4.11	පසු ආපදා අවශ්‍යතා තක්සේරුව **(Post Disaster Need Assessment - PDNA)**	**55**
8.4.12	ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතීන්හි ප්‍රගතිය	**55**
8.5	තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය	**56**
8.5.1	ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ සන්නිවේදන ජාලය ක්‍රියාකාරී තත්වයේ පවත්වාගෙන යාම	**56**
8.6	ආයතනයේ අභියෝග	**57**
8.7	ආයතනයේ මූල්‍ය ප්‍රගතිය	**59**
2024 දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශය		**(**Annexure **01)**
2014 - 2024 දක්වා අවුරුදු **10**ක මූල්‍ය තොරතුරු		**(**Annexure **02)**
2024 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව		**(**Annexure **03)**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද 2024 වාර්ෂික වාර්තාව එළි දැක්වීම වෙනුවෙන් ආරක්ෂක ලේකම්තුමාගේ සුභාශිංසන පණිවුඩය

ආපදා කළමනාකරණ මධයස්ථානය විසින් වාර්ෂිකව සකස් කරනු ලබන 2024 වාර්ෂික වාර්තාව එළිදැක්වීම පිළිබඳව ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් ලෙස හා අන්තර්කාලීන කළමනාකරණ කමිටු සභාපති වශයෙන් මා ඉතා සතුටට පත්වෙමි. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා මූලික වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුවන අතර එය ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටමේ සිටින පුරවැසියා දක්වා පුළුල් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම දක්වා කාර්යය භාර්යය අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් ආයතනයන් වන කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව මනා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාත්මක වනු දැකීම පැසසිය යුතුය. ලෝකයේ වඩාත්ම ආපදාවන්ගෙන් බලපෑමට ලක්වන දකුණු ආසියා කලාපයේ වර්ධනය වෙමින් පවතින මෙම තත්වය අවම කර ගැනීම සඳහා ලෝක සම්මුතීන්ට අනුගත වෙමින් ගෝලීය උණුසුම් වීම හා දේශගුණික විපර්යාස නිසා සිදුවන බලපෑම්වලට මුහුණ දීම සඳහා ආපදා අවදානම් අවම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුව, පැරිස් සම්මුතිය හා තිරසර සංවර්ධන ඉලක්ක අනුව යමින් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වැදගත් ප්‍රවේශයක් ලබාගෙන ඇත.

විශේෂයෙන්ම දිවයිනට බලපානු ලබන මෝසම් තත්වයත් සමඟ වර්ධනය වන ආපදාවන්ගේ බලපෑම පිළිබඳව පුරෝකතනය කිරීම, බලපෑමට ලක්විය හැකි ප්‍රදේශ සහ එවැනි ආපදා නිසා ඇතිවිය හැකි බලපෑම වළක්වා ගැනීම සඳහා පාර්ශවකාර ආයතන දායක කරගනිමින් පෙර සූදානම් කටයුතු ක්‍රියාත්මක කිරීම තුළත් ආපදාවන්ගෙන් වන බලපෑම සැලකිය යුතු මට්ටමකට අවම කිරීමට සමත්ව ඇත. එමෙන්ම සුනාමි ව්‍යවසනය සිදුව වසර 20ක් සපිරුණු 2024 වර්ෂයේ සැමරුණු ජාතික සම්මන්ත්‍රණය වැනි වැඩසටහන් මඟින් උගත් පාඩම් හා ඉදිරියේ දී ඇතිවිය හැකි ස්වාභාවික විපත්වලින් ජනතාවගේ ප්‍රත්‍යාස්ථතාවය, ජාත්‍යන්තර හවුල්කාරිත්වය හා විශ්ව විද්‍යාල පර්යේෂකයන්ගේ විද්‍යානුකූල ප්‍රවේශය තහවුරු කර ඇත.

ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම දක්වා විශ්ව විද්‍යාල, පාසැල්, ත්‍රිවිධ හමුදාව හා පොලිසිය මෙන්ම රජයේ නිලධාරීන් ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම තුළින් ආපදා අවස්ථාවට පෙර ආපදා අවස්ථාවකදී හා ඉන්පසු ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ මනා දැනුමක් ලබාදීම තුළින් විධිමත් ක්‍රමවේදයකට පාර්ශවකාර ආයතන යොමු කොට තිබීම පැසසිය යුතුය.

එමෙන්ම, ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ ලබාදීම සහ විධිමත් පුහුණු කිරීම් තුළින් පළමු ප්‍රතිචාර දක්වන කණ්ඩායම්වල ධාරිතා වර්ධනය කිරීම, සෙවීම් හා මුදවා ගැනීමේ ක්‍රමවේදයක් ශක්තිමත් කිරීම සහ ඇතිවිය හැකි ඕනෑම ආපදාවකට මුහුණදීම සඳහා ත්‍රිවිධ හමුදා හා පොලිසිය සම්බන්ධීකරණයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් මැදිරිය පැය 24 පුරාම පවත්වා ගෙන යාම මඟින් ජන ජීවිතය හා දේපළ සුරක්ෂිත කිරීමට කටයුතු කරඇත.

2024 වර්ෂයේ ක්‍රියාක්මක කරන ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තුළින් පුද්ගලයින් 540,000කට පමණ ප්‍රතිලාභ සැලසීමට හැකියාව ලැබී තිබීම ජයග්‍රහණයක් ලෙස සලකන අතර මේ සඳහා භාණ්ඩාගාරය මඟින් වෙන්කර තිබූ රු.මිලියන 200කින් 90%ක භෞතික ප්‍රගතියක් ඇති කර ගැනීමට

සමත්ව ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉලක්කගත වැඩපිළිවෙළ කරා ගමන් කිරීම සඳහා දේශීය රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විවිධ අයුරින් දායක වී ඇත. විශේෂයෙන්ම ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ ලෝක ආහාර වැඩසටහන (WFP) සඳහා මෙහිදී කෘතවේදීත්වය පලකරනු ලබන අතර ආපදා අවස්ථාවලදී ශ්‍රී ලාංකීය ජනතාව වෙනුවෙන් මෙම සංවිධාන මඟින් දෙනු ලබන දායකත්වය පිළිබඳව අපගේ ස්තූතිය හිමිවිය යුතුය.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සි (උපාය මාර්ගික අධ්‍යනය - චීනය), එම්එස්සි (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සි (ආරක්ෂක හා උපාය මාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩියු (චීනය), පිඑස්සි
සභාපති
අන්තර්කාලීන කළමනාකරණ කමිටුව
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
(ලේකම් / ආරක්ෂක අමාත්‍යාංශය)

1. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

සුරක්ෂිත ප්‍රජාවක් සහ තිරසාර සංවර්ධනයක්.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්ත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයන් තුළින් ආපදා කළමනාකරණ විෂයට සම්බන්ධ කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2. අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණය හා මූල්‍ය පාලනය අධීක්ෂණය හා මෙහෙයවීම සම්බන්ධව තීරණ ගන්නා වූ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අන්තර්කාලීන කළමනාකරණ කමිටුව නම් වේ. එය ආපදා කළමනාකරණ විෂයභාර කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර 2024 වර්ෂය තුළ දී රැස්වීම්වාර 6ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

වගුව 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කමිටුවේ සංයුතිය

ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය	-	සභාපති
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) ආරක්ෂක අමාත්‍යාංශය	-	සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය	-	සාමාජික
අතිරේක ලේකම් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය	-	සාමාජික
අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	-	සාමාජික
ප්‍රධාන ගණකාධිකාරී ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය	-	සාමාජික
අධ්‍යක්ෂ ජනරාල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	-	ලේකම්

3. විගණන සහ කළමනාකරණ කමිටු සංයුතිය (AMC)

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත දැක්වේ.

වගුව 3.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

අනු අංකය	නම, තනතුර හා ආයතනය	කමිටුවේ තනතුර
01	එම්.කේ.එස්. ජයසේන මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය	සභාපති
02	පී.ඩී.අයි.එල්. විජේගුණවර්ධන මහත්මිය - අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති), ආරක්ෂක අමාත්‍යාංශය	සාමාජික
03	එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා - ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අංශය	සාමාජික
04	එන්.ඒ.ඩී.එන්. අතුකෝරල මහත්මිය - විගණන අධිකාරි, ජාතික විගණන කාර්යාලය.	නිරීක්ෂක
05	ආර්.එස්.එම්.අයි. ජයතිලක මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක, ආපදා කලමනාකරණ අංශය.	නිරීක්ෂක
06	මේජර් ජෙනරාල් එච්.එම්.යූ.හේරත් මහතා (විශ්‍රාමික) - අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක.	ලේකම්
07	ජේ.එච්.පී. ජයලත් මහතා - ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.	කැඳවුම්කරු

4. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර

වගුව 4.1: අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම්

නම	තනතුර	අධ්‍යාපනික සුදුසුකම්
මේජර් ජෙනරාල් එච්. එම්.යු. හේරත් (විශ්‍රාමික) ආර්ඩබ්පි ආර්එස්පි විඑස්වි යුඑස්පි එම්එම් එච්ඩිඑම්සි පිඑස්සි	අධ්‍යක්ෂ ජනරාල්	කළමනාකරණ අධ්‍යනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඉන්දියාව)
අමරසිංහ ආරච්චිලාගේ අනෝජා කුමුදු කුමාරි සෙනෙවිරත්න	අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන)	විද්‍යාපති (භූ ගර්භ දත්ත විද්‍යාව හා භූ සමීක්ෂණ) (නෙදර්ලන්තය) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (මානව සම්පත් කළමනාකරණය) විද්‍යාවේදී (විශේෂ) (භූ ගර්භ විද්‍යා) ඩිප්ලෝමාව (ජාත්‍යන්තර සම්බන්ධතා) වරලත් ඉංජිනේරු ආයතනය (එ.රා.) (කොටස I සහ II)
තොටුපිටියගේ නන්දසිරි කුමාර පෙරේරා	අධ්‍යක්ෂ (මෙහෙයුම්)	රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව (බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යන මධ්‍යස්ථානය) ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (ඉන්දියාව)
වැලිහිඳ පතිරන්නැහැලාගේ අදීප කමල්ජිත් තිලකරත්න	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)	විද්‍යාපති (කළමනාකරණය) ශාස්ත්‍රවේදී ඩිප්ලෝමාව (කළමනාකරණය) විද්‍යාවේදී (සංග්‍රාම අධ්‍යනය)
කිරිපිටිය අබේසිංහගේ නිශාන්ත	අධ්‍යක්ෂ (මුදල්)	විද්‍යාපති (වෘත්තිය ගිණුම්කරණය) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විද්‍යාවේදී ගණකාධිකරණය (විශේෂ) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
චතුර ලියන ආරච්චිගේ	අධ්‍යක්ෂ (පෙර සූදානම්) රා. ඉ	විද්‍යාපති (ආපදා කළමනාකරණ) - පේරාදෙණි විශ්ව විද්‍යාලය විද්‍යාවේදී (විශේෂ) (භෞතික විද්‍යාව) - පේරාදෙණි විශ්ව විද්‍යාලය
කොඩිප්පිලි ආරච්චිගේ දොන් ප්‍රදීප් කුමාර කොඩිප්පිලි	අධ්‍යක්ෂ (පුහුණු හා දැනුවත් කිරීම්) - රා.ඉ	විද්‍යාවේදී (විශේෂ) ගෞරව උපාධිය (කෘෂිකර්මය) - රුහුණ විශ්වවිද්‍යාලය ශාස්ත්‍රපති උපාධිය (ආපදා කළමනාකරණය, විශ්ලේෂණය සහ අවමකිරීම) - කොළඹ විශ්වවිද්‍යාලය

5. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල විස්තර

5.1 2024 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල සිවිල් කාර්යය මණ්ඩලය

වගුව 5.1: 2024.12.31 දිනට කාර්යය මණ්ඩල විස්තරය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	0	1
අධ්‍යක්ෂ	6	4	2
ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක / අභ්‍යන්තර විගණක	1	1	0
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ	15	12	03
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	20	5
ගිණුම් නිලධාරී	1	1	0
පරිපාලන නිලධාරී	1	0	1
පුද්ගලික සහකාර	1	0	1
දුර දැනීම/භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	1	0	1
ජාල පද්ධති පරිපාලක	1	0	1
පුස්තකාලයාධිපති	1	0	1
සංවර්ධන නිලධාරී	101	0	101
භාෂා පරිවර්තක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	6	3	3
චලන හා නිශ්චල කැමරා ශිල්පී	1	1	0
සන්නිවේදන කාර්මික ශිල්පී	3	1	2
ගුවන් විදුලි ක්‍රියාකරු	1	1	0
කළමනාකරණ සහකාර/ආපදා කළමනාකරණ සහකාර	201	157	44
රියදුරු	39	35	04
කාර්යාල සහායක	35	30	05
එකතුව	**447**	**269**	**178**

5.2 2024 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩල විස්තර

වගුව 5.2: 2024 දෙසැම්බර් 31 දිනට ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලයේ විස්තර


ස්ථානය	ශ්‍රී ලංකා යුධ හමුදාව		ශ්‍රී ලංකා නාවික හමුදාව		ශ්‍රී ලංකා ගුවන් හමුදාව		ශ්‍රී ලංකා පොලිසිය		එකතුව	
	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රධාන කාර්යාලය	01	10	02	09	01	07	04	05	08	31
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - කොළඹ			01		01	16	-	-	02	16
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - පුත්තලම					01	11	-	-	01	11
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - හම්බන්තොට			01		01	15	-	-	02	15
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - කළුතර	02	24	01				-	-	03	24
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - ගාල්ල	02	25					-	-	02	25
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - මාතර	02	22					-	-	02	22
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - අනුරාධපුර	01								01	-
එකතුව	**08**	**81**	**05**	**09**	**04**	**49**	**04**	**05**	**21**	**144**
මුළු එකතුව	**89**		**14**		**53**		**09**		157	

5.3 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

මෙම ඒකක දිස්ත්‍රික් 25 තුළම පිහිටුවා ඇත. එක් එක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කාර්ය මණ්ඩලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්), කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කාර්යාල සහායකවරුයෙකු මෙන්ම රියදුරුවරයෙකුගෙන් ද සමන්විත වේ.

දිස්ත්‍රික්කය ආපදාවලට භාජනය වීමට ඇති නැඹුරුතාවය අනුව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකයින් සංඛ්‍යාව වෙනස් වේ. මුළු එකතුව ගත් කල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරුන් 103 දෙනෙකු දිස්ත්‍රික්ක 25හි සේවය සඳහා යොදවා ඇත. කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අනුරාධපුරය සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක ශ්‍රී ලංකා යුධ හමුදා සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ (සහකාර අධ්‍යක්ෂවරුන් ලෙස) පරිපාලනය යටතේ ද සෙසු දිස්ත්‍රික් ඒකක සිවිල් දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්ගේ පරිපාලනය යටතේ ද ක්‍රියාත්මක වේ. සියලුම දිස්ත්‍රික් ආපදා

කළමනාකරණ ඒකක එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධව දිස්ත්‍රික් ලේකම්ගේ මෙහෙයුම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. රූප සටහන 5.1හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය දැක්වේ.



සටහන 5.1: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

6. විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යය භාර්යය

ජාතික විගණන කාර්යාලයෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කර තිබූ විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව මෙහිදී සාකච්ඡාවට භාජනය කර ඇත. විශේෂයෙන්ම අභ්‍යන්තර විගණක විසින් 2024 වර්ෂය සඳහා සකස් කර තිබූ අවදානම් පදනම් කරගත් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය, පාලන ක්‍රියාවලිය හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළව මතුකර තිබූ විගණන නිරීක්ෂණ මෙම කමිටුවේදී වැඩිදුරටත් විශ්ලේෂණය කරමින් ආයතනයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ඉවහල් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ ලබා දී ඇත.

ඒ අනුව මුදල් රෙගුලාසි 133 හා 134 දැක්වෙන කාර්යභාරයන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල දැක්වෙන උපදෙස්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ජාතික විගණන පනත හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ නියමයන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේදී කරුණු සාකච්ඡා කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වය වෙත අවශ්‍ය මඟපෙන්වීම් සිදුකර ඇත. එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ හා විගණන

හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලා ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2024 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කළමනාකාරිත්වය වෙත යොමු කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවට අදාළව ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති, වැඩසටහන් හා කාර්යභාරයන්වල පූර්ව නිශ්චය කර ගත් අරමුණු ලභා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම කළමනාකරණ අංශයක් ම සමාලෝචනය කිරීම සිදු කිරීම සහ එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසර ලත් කාල සීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩසටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න නිර්ණය කිරීම සිදු කිරීම පැවරී ඇති අතර එම කාර්යයන් ඉදිරි වර්ෂවලදී ද මනාව සිදු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සැලසුම් කර ඇත.

6.1 ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණකගේ වාර්තාව

මුදල් රෙගුලාසි අංක 133 සහ 134, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා ජාතික විගණන පනතෙහි සඳහන් නියමයන්,රාජ්‍ය මූල්‍ය කළමනාරකණ පනත ප්‍රකාරව සහ අභ්‍යන්තර විගණන ප්‍රමිතීවලට අනුකූලව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අභ්‍යන්තර විගණකවරයකු ප්‍රථම වරට බඳවාගනු ලැබුවේ 2011.10.24 දින වන අතර එදින සිට මේ දක්වා අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක වේ.

අභ්‍යන්තර විගණනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා වටිනාකමක් එක් කිරීම සඳහා ස්වාධීන වූ අපක්ෂපාතී සහතික වීමක් සහ උපදේශාත්මක සේවාවක් සපයයි. අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ පාලන ක්‍රියාවලින්හි සඵලදායකත්වය ඇගයීමට ලක්කරමින් එය වැඩිදියුණු කිරීමට සහාය දක්වන ක්‍රමවත් හා ශික්ෂිත මාර්ගයක් වශයෙන් එය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ඉටු කර ගැනීමේදී සහාය වේ.

එමෙන්ම ආපදා කළමනකාරණ මධ්‍යස්ථානයේ, ආයතනයක් වශයෙන් පද්ධතිය තුළ සිදු විය හැකි වංචා, චේතනාන්විතව සිදුකරන වැරදි, දෝෂ සහ අඩුපාඩු, අකාර්යක්ෂමතාවයන්, අපතයන්, සඵලදායී නොවන තත්වයන්, බැඳියා පිළිගැටුම් සහ අක්‍රමිකතාවයන් පිළිබඳව අභ්‍යන්තර විගණන ප්‍රමිතීවලට අනුව අභ්‍යන්තර විගණනයේ විෂය පථය අනුව කළමනාකරණය වෙත වාර්තා කිරීමේ බැඳියාවක්ද අභ්‍යන්තර විගණනයට පවතී.

2024 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා මධ්‍යස්ථානයේ අරමුණු ලභාකර ගැනීම සඳහා අදාළ උපදෙස් හා තීරණ ලබා දී ඇත.

වර්ෂය තුළදී මූලික අභ්‍යන්තර විගණන වාර්තාවද ඇතුළත්ව අභ්‍යන්තර විගණන කාර්තු වාර්තා 05ක් නිකුත් කර තිබූ අතර අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන විමසුම් හා වාර්තා 22ක් ද නිකුත් කර ඒ මගින් මධ්‍යස්ථානයේ මෙහෙයුම් ක්‍රියාවලිය සාර්ථක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දී තිබුණි.

වර්ෂ 2012 සිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පාර්ලිමේන්තුවේ පැවැත්වෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කැඳවා නොතිබූ හෙයින් වසර 13ක කරුණු එම රැස්වීමේදී සාකච්ඡාවට ගැනීමට මේවන විටත් නොහැකිව තිබූ බව අභ්‍යන්තර විගණනය විශේෂයෙන් නිරීක්ෂණය කරයි. එමෙන්ම 2013 වශයෙන් පසුව 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනත ප්‍රකාරව ජාතික ව්‍යසන කළමනාකරණ සභාව ද විධිමත්ව ලෙස පැවැත්වීමට නොහැකි වී තිබුණි.

7. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ හැඳින්වීම


ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 8 වන වගන්තිය ප්‍රකාරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මඟපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය, ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ සඳහා මඟපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරණ මෙම පනත පත්විය.

මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ආපදා ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

7.1 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව ව්‍යසන කළමනාරකරණය සඳහා වූ ජාතික සභාව 2005 වසරේ දී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය ගරු ජනාධිපතිතුමාගේ සභාපතීත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරු, පළාත් ප්‍රධාන අමාත්‍යවරු (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි (සටහන 7.1).



සටහන 7.1: ජාතික සභාවේ සංයුතිය

7.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරණ පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- සමුද්‍රීය උපද්‍රවයන්
- ගිනි
- වසංගත තත්ත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ බාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු

7.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ, ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්ත්වයක් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කරමින් සුරක්ෂිත ප්‍රජාවක් ඇති කිරීමයි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් අංශ හයකින් සහ අභ්‍යන්තර විගණන අංශය, තොරතුරු හා සන්නිවේදන අංශයකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාවලිය සකස් වී ඇත.

ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත සඳහන් වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
4. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
5. මානව සම්පත් හා පරිපාලන අංශය
6. මූල්‍ය අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කෙරේ.


7.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම්,

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.
- පෙර සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම හා ප්‍රචාරණය.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම් ව්‍යුහාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අවම කිරීම සඳහා සංවර්ධන ප්‍රවාහයට ආපදා අවදානම් අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

- ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

7.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය



සටහන 7.2: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

8. 2024 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය

8.1 පෙර සූදානම් හා සැලසුම් අංශය

2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් හා සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ නිරන්තරයෙන් ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙරසූදානම් හා සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන එක් කාර්යයක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛනයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවාද යන්න සැලැස්ම තුළ ලේඛනගත කර ඇත.

පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

8.1.1 දිස්ත්‍රික් මට්ටමෙන් සිදුකරන ලද පෙර සූදානම් වැඩසටහන්

2024 වර්ෂයට ලෝක ආහාර සංවිධානයෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබුණු අතර එම ප්‍රතිපාදන යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලදි. රටෙහි ආර්ථික තත්ත්වය ප්‍රවාහන අපහසුතා සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරින ලදි.

වගුව 8.1.1: දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදා හැරීම හා වියදම් කිරීම 2022 - 2024

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)	සටහන්
2022	7.50	2.43	රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අංක BD/CBP/01/01/04 – 2022 දරන 2022.04.26 දිනැතිව නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022ට යටත්ව වියදම් කරන ලදි.
2023	5.00	1.3	මහා භාණ්ඩාගාරයෙන් රු.මි.5ක මූල්‍ය ප්‍රතිපාදන අනුමත වූ නමුත් මුදල් නොවැම්බර් මස ලැබීම හේතුවෙන් වැඩසටහන් සිදුකිරීමට නොහැකි විය.
2024	5.00	4.49	

දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍යතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2024 වර්ෂය තුළදී පෙර සූදානම් අංශය විසින්

ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත.

වගුව 8.1.2: 2024 වර්ෂයේ පෙර සූදානම් අංශය විසින් සිදුකරන ලද වැඩසටහන්

වැඩසටහන	මහා භාණ්ඩාගාරය මඟින් ලබාදුන් ප්‍රතිපාදන රු. මි. 5.00	වැඩසටහන් ප්‍රමාණය
දිස්ත්‍රික් මෝසම් පෙර සූදානම් වැඩසටහන්	0.79	24
ප්‍රාදේශීය මෝසම් පෙර සූදානම් වැඩසටහන්	1.62	92
පාසල් ආරක්ෂණ වැඩසටහන්	0.37	19
නායයෑම් පෙරහුරු වැඩසටහන්	0.16	05
ගංවතුර පෙරහුරු වැඩසටහන්	0.17	05
වේළි ආරක්ෂණ වැඩසටහන්	0.20	04
අ.පො.ස (සා/පෙ) සහ (උ/පෙ) සහ මැතිවරණ මාර්ගෝපදේශ	0.32	මාර්ගෝපදේශ 200
වෙනත් පෙර සූදානම් වැඩසටහන්	0.29	

8.1.2 නිරිතදිග මෝසම් සහ ඊසානදිග මෝසම් පිළිබඳ ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන

අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි නිරිතදිග මෝසම් සහ ඊසානදිග මෝසම් සක්‍රීය වීමත් සමඟ දිවයිනට බලපෑ හැකි ආපදා හානි අවම කර ගැනීම උදෙසා පූර්ව සූදානම් කටයුතු පිළිබඳව පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම හා සම්බන්ධීකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම වෙනුවෙන් සංවිධානය කරන මෝසම් ආපදා පෙර සූදානම් කමිටු දැනුවත් කිරීමේ රැස්වීම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් 2024 ජුනි මස 15 වන දින සහ 2024 දෙසැම්බර් මස 19 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මෝසම් සක්‍රිය වීමත් සමඟ ඉදිරි කාලසීමාව තුළ ඇතිවිය හැකි ආපදා තත්වයන් පිළිබඳ පුරෝකථනය කිරීම, බලපෑමට ලක්විය හැකි ප්‍රදේශ සහ එවැනි ආපදා නිසා ඇතිවිය හැකි බලපෑම වළක්වා ගැනීම සඳහා දැනටමත් ගෙන ඇති පියවර සහ ඉදිරි සැලැසුම් පිළිබඳව පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම, ඇතිවිය හැකි ආපදා අවදානම් කළමනාකරණය සඳහා පාර්ශවකාර ආයතනය දායක කරගැනීම මෙම වැඩසටහන්වල අරමුණ විය.

මෙම කාලසීමාව තුළ ඇති විය හැකි ආපදාවලට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ ජාතික මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සහ අනුගමනය කළ යුතු උපදෙස් මාලා නිකුත් කිරීමට කටයුතු කරන බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් අවධාරණය කරන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූලිකත්වයෙන් පවත්වන ලද මෙම වැඩසටහන් සඳහා ත්‍රිවිධ

හමුදාව ඇතුළුව රාජ්‍ය ආයතන නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය නියෝජනය කරමින් ආයතන රැසක නිලධාරීන් සම්බන්ධ වන ලදි.

8.1.3 ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය හා ස්වාභාවික ව්‍යසන සඳහා කාර්යක්ෂම ආපදා කළමනාකරණය

2024 මාර්තු මස 11 වන දින ලෝක ආහාර සංවිධානයේ නියෝජිත කණ්ඩායම සමඟ "ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය හා ස්වාභාවික ව්‍යසන සඳහා කාර්යක්ෂම ආපදා කළමනාකරණය" යන මාතෘකාව යටතේ 2024 වර්ෂය සඳහා ලෝක ආහාර වැඩසටහනේ (WFP) ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදි. එහිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රමුඛතාවයට අනුකූලව සහයෝගීතාවය දැක්විය යුතු අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කල අතර අදාළ කාල රාමුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු විය. මේ සඳහා ජනාධිපති කාර්යාලය නියෝජනය කරමින්, ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතාව සඳහා වූ හවුල්කාරිත්ව ලේකම් කාර්යාලය පැමිණි අතර පූර්වාපේක්ෂක ක්‍රියාමාර්ග වැඩමුළුව සඳහා කලාපීය උපදේශක පැමිණෙන ලදි.

ලෝක ආහාර වැඩසටහනේ (WFP) ප්‍රතිපාදන මඟින් සිදුකරන ලද පෙර සූදානම් වැඩසටහන්

- පාර්ශවකාර ආයතන සමඟ ජාතික මෝසම් රැස්වීමක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී 2024 මැයි 16 වන දින පාර්ශවකරුවන් 50ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.
- මහනුවර, ගම්පහ, මාතර, කෑගල්ල, කළුතර, නුවරඑළිය, හම්බන්තොට, බදුල්ල හා රත්නපුර යන දිස්ත්‍රික් 9ක නිරිතදිග මෝසම් පෙර සූදානම් වැඩසටහන් සඳහා රු.900,000/-ක ප්‍රතිපාදන නිකුත් කරන ලදි.

8.1.4 ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්දායි ක්‍රියාකාරී රාමුවට අදාළව ජාතික හා ප්‍රාදේශීය උපාය මාර්ග ක්‍රියාවට නැංවීම (LDRR)

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වර්ෂ 2015 දී ක්‍රියාවට නංවන ලද සංවර්ධන න්‍යාය පත්‍රයේ පළමු ප්‍රධාන ගිවිසුම ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්දායි රාමුව (2015 – 2030) සාමාජික රටවල ආපදා අවදානමට සංවේදී වී සංවර්ධන අරමුණු කරා තිරසාර ලෙස ළඟා වීමට ක්‍රියාකාරී පදනම සකස් කරඇත. 2015 වර්ෂයේ පවත්වන ලද ආපදා අවදානම අවම කිරීම සම්බන්ධ එක්සත් ජාතීන්ගේ තෙවන ලෝක සමුළුවට අනුව එක්සත් ජාතීන්ගේ මහා සමුළුව විසින් ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්දායි රාමුව පිළිගෙන තිබෙන අතර එමඟින් ආපදා අවදානම හා ආපදා හේතුවෙන් ජීවිත, ජීවනෝපායන්, සෞඛ්‍යමය හානි මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට හෝ රටක සිදුවිය හැකි



ආර්ථික, සමාජීය, සංස්කෘතික, භෞතික සහ පාරිසරික වත්කම්වලට සිදුවන හානි සැලකිය යුතු මට්ටමින් අවම කිරීම සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා නව ජාතික ක්‍රමෝපායන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ආපදා අවදානම් අවම කිරීමේ කටයුතු සැලැසුම්කරණය පළාත් පාලන ආයතනවල ධාරිතා වර්ධනය කිරීමේ (CDLG) ව්‍යාපෘතිය යටතේ උතුර, උතුරු මැද, නැගෙනහිර හා ඌව යන පළාත්වල පළාත් පාලන ආයතන 134ක් සඳහා සැලසුම් සකස් කිරීම ආරම්භ කර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය දායකත්වය මඟින් "ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීම සඳහා වන ජාතික ක්‍රමෝපාය" වැඩසටහන 2022 වසරේදී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව, අදාළ කාර්යය සඳහා රු.මි. 40ක මූල්‍ය ප්‍රධානයක් ලබා දීමට එකඟ වූ නමුත් නිකුත් කරන ලද්දේ රු.මිලියන 30ක් පමණි. එම මුදලින් රු. මි. 15ක් 2022 වසරේ ද තවත් රු.මි. 15ක් 2023 වසරේදී ද ලබා දෙන ලදී. ඒ අනුව, එම 2022 හා 2023 වර්ෂයේ වියදම් සිදු කර 2024 වසර සඳහා ඉතිරි මුදල්වලින්, 2024 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 වන දින වන විට රු.මි. 4.5 ක් වැය කර සැලසුම් 32ක් සකස් කරන ලදී.



ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ සැලැසුම් ක්‍රියාත්මක කිරීම - මුලතිව් දිස්ත්‍රික්කය



ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ සැලැසුම් ක්‍රියාත්මක කිරීම - යාපනය දිස්ත්‍රික්කය

8.1.5 විභාග සහ මැතිවරණ කාලසීමාව තුළ ආපදා හේතුවෙන් ඇතිවිය හැකි බාධා වළක්වා ගැනීම සඳහා වැඩපිළිවෙළක් (අ.පො.ස (සා/පෙළ), අ.පො.ස (උ/පෙළ) සහ මැතිවරණ)

සාමාන්‍ය පෙළ විභාගය 2024 මැයි මස 06 වන දින සිට මැයි මස 15 වන දින දක්වා පවත්වන ලද අතර උසස් පෙළ විභාගය 2024 නොවැම්බර් මස 25 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා පවත්වන ලදී. මෙම දිනයන් දක්වා පවත්වන ලද විභාග හා මැතිවරණ කාලසීමාවන් තුළ විභාගවලට පෙනී සිටින ලද විභාග අපේක්ෂක සිසුන්ගේ (එනම් විභාග අපේක්ෂකයින්) සහ නිලධාරීන්ගේ ආරක්ෂාව සහතික කරන අතරම, අනපේක්ෂිත ස්වාභාවික විපත් මධ්‍යයේ විභාගය සහ මැතිවරණය බාධාවකින් තොරව පැවැත්වීම සහතික කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විභාග දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමිෂන් සභාව සහ අනෙකුත් පාර්ශවකාර ආයතන සමඟ මෙම මාර්ගෝපදේශය සකස් කරන ලදි.

8.1.6 " From Tragedy to Resilience : Reflections over two decades, Retrospect the 2004 Indian Ocean Tsunami" ජාතික සම්මන්ත්‍රණය

ජාත්‍යන්තර සුනාමි අනුස්මරණ වැඩසටහන 2024 නොවැම්බර් මස 04 වන දින පවත්වන ලද අතර සුනාමි ව්‍යසනය සිදු වී වසර 20ක් සැපිරීම නිමිති කොටගෙන ආපදා කළමනාකරණයේ සංවර්ධනය, උගත් පාඩම් හා ඉදිරියේදී මෙවැනි ස්වභාවික විපත්වලින් ජනතාවගේ ප්‍රත්‍යාස්ථතාවය හා ස්වභාවික විපත්වලින් ශ්‍රී ලංකාවට බලපෑමක් ඇතිවිය හැකි හා අනාගතයේදී ඇතිවිය හැකි උවදුරු සම්බන්ධව විද්වත් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. එහිදී සෙන්දායි ක්‍රියාකාරී රාමුවේ ප්‍රමුඛතා 04ට අනුකූලව විද්වත් සාකච්ඡාවක් සංවිධානය කළ අතර ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර විද්වතුන්, විශ්වවිද්‍යාලවල පර්යේෂකයන් ආපදා කළමනාකරණ විෂයෙහි නිපුනයන් සම්බන්ධ කර ගනිමින්,

- සුනාමි අවදානම් තක්සේරුව, ගොදුරුතාවය හා සුනාමි සිතියම් සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීම් අවසන් පුද්ගලයා දක්වා ළඟා කිරීමේ ක්‍රමවේදයක් සහ ජනතාව සුරක්ෂිතව හා ආරක්ෂිත ස්ථාන කරා ගෙන යෑමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- අවදානම් කළමනාකරණය ජාත්‍යන්තර, ජාතික, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරී මට්ටමේ යාන්ත්‍රණය සහ එහි අඩු ලුහුඬුකම් සාකච්ඡා කර ඉදිරියේදී එහි ව්‍යූහයන් වෙනස්විය යුතු ආකාරය.
- ආපදාවන්ට ගොදුරුවන ජනතාව වර්ගීකරණය විශේෂයෙන් කාන්තාවන්, ළමුන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ඇතිවිය හැකි උපද්‍රව හා ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ ක්‍රියාකාරිත්වය හා ඉදිරියේදී මෙවන් ව්‍යවසනයකට මුහුණ දීමට හැකි යාන්ත්‍රණය.
- මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර, ජාතික ක්‍රමවේදය හා ඉදිරියේදී ජාතික වශයෙන් ඉදිරිපත් කළ යුතු යාන්ත්‍රණය.

ශ්‍රී ලංකාව වශයෙන් ඉදිරියේදී ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම, ජාතික මෙහෙයුම් සැලැස්ම යන අනෙකුත් ස්වභාවික මිනිසා විසින් ඇති කරන ආපදා තත්වයන්ට මුහුණ දීම සඳහා (Holistically approach) පෙර සූදානම් යාන්ත්‍රණයක් සකස් කරන ලදී.






8.1.7 වෙනත් පෙර සූදානම් වැඩසටහන්

ශ්‍රී ලංකාවේ වසර මුල පැවති අධික රස්නය සහ වියළි කාලගුණික තත්වය පිළිබඳ සලකා බැලීම සඳහා විශේෂ රැස්වීමක් 2024.03.12 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි. මෙම රැස්වීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර මේ සඳහා ප්‍රධාන පාර්ශවකාර ආයතන වූ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ ලෝක සෞඛ්‍ය සංවිධානය නියෝජනය කරමින් නියෝජිත මහත්ම මහත්මීන් සහභාගී විය.

8.2 පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනතින් ආපදා කළමනාකාරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති වගකීම් අනුව ආපදා අවදානම් කළමනාකරණය උදෙසා මහජනතාව තුළ ව්‍යාසන ඇතිවීම, ඒවායේ ව්‍යාප්තිය හා හානි සම්බන්ධව දැනුම හා අවබෝධය දියුණු කිරීම මෙන්ම ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායකවන සියලු පාර්ශවකාර ආයතන හා සංවිධාන සම්බන්ධීකරණය කරමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු හා දැනුවත් කිරීම් අංශය විසින් අදාළ පාර්ශව හා කණ්ඩායම් පුහුණු කිරීම හා දැනුවත් කිරීම සිදුකරනු ලැබේ. ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම හා ග්‍රාමීය මට්ටම දක්වා දිවයිනේ සියලු දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා පවතින ආපදා අවදානම් තත්ත්වයන් අවබෝධ කර ගෙන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2024 වර්ෂයේදි ද අඛණ්ඩව සිදුකරන ලදි.

ඒ අනුව භාණ්ඩගාර මූල්‍ය ප්‍රතිපාදන රු.මි 7.0 සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් ලබා දුන් රු.මි. 0.07ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන දැනුවත් කිරීම් අංශය මඟින් දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් පහත පරිදි සිදු කරන ලදි.



සටහන 8.2.1: 2024 වර්ෂයේ දැනුවත් කිරීමේ අංශයේ මූල්‍ය ප්‍රතිපාදන භාවිතය

8.2.1 ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

<u>විශ්ව විද්‍යාල, පාසල් සිසුන්, ත්‍රිවිධ හමුදා, පොලිස් නිලධාරීන්, හා අනෙකුත් පාර්ශවකාර ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන</u>

ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ තාක්ෂණික ආයතනයන්හි සම්පත් දායකත්වය සහිතව ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල, පාසල් සිසුන්, ත්‍රිවිධ හමුදා, පොලිස් නිලධාරීන්, හා අනෙකුත් පාර්ශ්වකාර ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් දැනුවත් කිරීම් අංශය මඟින් සිදු කරමින් ඇති අතර ඒ අනුව 2024 වර්ෂයේදී සිදු කරන ලද වැඩසටහන් පිළිබඳව විස්තරය පහත දක්වා ඇත.

වගුව 8.2.1: විශ්ව විද්‍යාල, පාසල්, ත්‍රිවිද හමුදාව හා පොලිසිය ඇතුළු පාර්ශවකාර ආයතනයන්හි නිලධාරීන් සහ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
	මූල්‍ය ප්‍රතිපාදන සහිතව		
01	ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳව ත්‍රිවිධ හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	16	679
02	ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳව සෞඛ්‍ය අංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	01	05
03	ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳව විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	03	99
04	ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	03	159
05	ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳව අනෙකුත් පාර්ශවකාර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	02	28
	එකතුව	**25**	**970**

පාර්ශවකාර ආයතනවල අවශ්‍යතාව මත හා පුද්ගලික අංශයේ ඉල්ලීම් පරිදි ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 18 ක් සඳහා සම්පත්දායකත්වය ලබාදී ඇති අතර ඒ සඳහා ප්‍රතිලාභීන් 2,265 දෙනෙකු සහභාගී වී ඇති අතර ඒ පිළිබඳ විස්තරය පහත දක්වා ඇත.




ත්‍රිකුණාමලය චීන වරාය ගුවන් හමුදා කඳවුරේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.02.02




කොළඹ ජාත්‍යන්තර පාසලේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන. 2024.02.15




බුත්තල ශ්‍රී ලංකා යුධ හමුදා පුහුණු කඳවුරේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.03.15




මහාරාජා කළමනාකරණ ආයතනයේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන - 2024.03.26




කොළඹ විශ්ව විද්‍යාලයේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන - 2024.04.04




මොරවැව ශ්‍රී ලංකා ගුවන් හමුදා පුහුණු ආයතනයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - 2024.07.30

8.2.2 ආපදා සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමේ පුහුණු මෙවලම් සකස් කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී පුහුණු මෙවලම් සකස් කිරීම දැනුවත් කිරීමේ අංශය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව ත්‍රෛයි මාසික පුවත්පත් සඟරාව 2024 වර්ෂයේ කාර්තුවලට අදාළව සකස් කර අදාළ අංශ වෙත බෙදා හැරීමට කටයුතු කරන ලදි. රසායනික ජීවවිද්‍යාත්මක හා න්‍යෂ්ඨික ආපදා සම්බන්ධ පුවරු 25ක් සකස් කර ප්‍රදර්ශන කටයුතු සඳහා භාවිතා කිරීමට දිස්ත්‍රික්ක 25 සඳහා ලබාදෙන ලදි.

ලෝක ආහාර වැඩසටහනේ (World Food Programme) මූල්‍ය දායකත්වය යටතේ ගංවතුර, සුනාමි, භූමි කම්පා, ප්‍රථමාධාර, නායයාම්, සුළිසුලං සහ අකුණු යන ආපදා සම්බන්ධයෙන් පොත් කට්ටල 07ක් දමිළ භාෂාවට පරිවර්තනය කර පොත් 04ක මුද්‍රණ කටයුතු අවසන් කර ඇත.



රසායනික ජීවවිද්‍යාත්මක හා න්‍යෂ්ඨික ආපදා සම්බන්ධව දැනුවත් කිරීමේ පුවරු



ප්‍රදර්ශන හරහා මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ප්‍රදර්ශන කට්ටල

8.2.3 CBRNE ජාතික සම්බන්ධීකරණ වැඩසටහන

2005 අංක (13) දරණ ආපදා කළමනාකරණ පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවට තර්ජනයක් විය හැකි ආපදා වර්ග 21 හඳුනා ගෙන ඇති අතර එහිදී CBRNE (රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ස්ඵෝටන) ආපදා ඒ අතර වේ. රසායනික කාන්දු වීම් සිදුවීමෙන් පසු ඉක්මණින් ගලවා ගැනීමේ මෙහෙයුම් ආරම්භ කිරීමට CBRNE උපද්‍රව ද්‍රව්‍ය හඳුනා ගැනීමට සහ රසායනික කාන්දු වීම් පාලනය කිරීමට ක්‍රමානුකූල ප්‍රවේශයක් අවශ්‍ය වේ. එවැනි මැදිහත්වීම් සාක්ෂාත් කර ගැනීම සඳහා වන තීරනාත්මක අභියෝගයක් වන්නේ මෙම අන්තරායන් කල්තියා හඳුනා ගැනීමට ස්වාභාවික සංවේදක නොමැති වීම සහ ඒ සඳහා නිවැරදි මෙවලම් මෙන්ම විශේෂ පුහුණු අවශ්‍යතා ද පවතී.

එබැවින් රට තුළ CBRNE අවදානම් අවම කිරීම සඳහා ඵලදායී පෙර සූදානම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ පවතින සම්බන්ධීකරණ ප්‍රවේශයන් ශක්තිමත් කිරීම සහ යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වන අතර ඒ අනුව පාර්ශවකරුවන්ගේ නියෝජිතායතන හා ඒවායේ වගකීම් හඳුනාගැනීම, දත්ත පද්ධතියක් සහ CBRNE අවදානම් කලාප සිතියම්කරණය සංවර්ධනය කිරීම සහ ප්‍රජාවට ඔරොත්තු දීමේ හැකියාව සඳහා ධාරිතා වැඩිදියුණු කිරීම අරමුණු කර ගෙන මෙම වැඩසටහන සැලසුම් කරන ලදි. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ශවකාර

ආයතන සහභාගීත්වයෙන් මූලික සාකච්ඡාවන් සිදු කරන ලද අතර පාර්ශවකාර ආයතනවල කේන්ද්‍රීය නිලධාරීන් ජාතික හා දිස්ත්‍රික්ක මට්ටමින් හඳුනා ගැනීමට කටයුතු සිදු කරන ලදි.





ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ශවකාර ආයතන සමඟ පැවති සාකච්ඡාව - 2024.05.17

8.2.4 එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පැවැත්වූ කලාපීය හවුල්කරුවන්ගේ පෙර සූදානම් වැඩමුළුව

ඉන්දියානු සාගර කලාපීය සහභාගීත්වය තුළින් රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණවේදීන් සහ න්‍යෂ්ඨික ආපදා සඳහා කලාපීය සූදානම වැඩිදියුණු කිරීම සඳහා දෙසැම්බර් මස 03 සිට 05 දක්වා එක්සත් ජනපද රජයේ මූල්‍ය දායකත්වය යටතේ ශ්‍රී ලංකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව ජීවිත ආරක්ෂා කිරීම, පරිසරය ආරක්ෂා කිරීම සහ සියලු ප්‍රජාවන්ට සිදුවිය හැකි හානි අවම කිරීම සඳහා මෙන්ම හදිසි අවස්ථාවලදී විදේශීය ආධාර ලබාදීමේ සම්මත පටිපාටීන් හඳුනාගැනීම සඳහා මෙම වැඩමුළුව පවත්වන ලදී

ශ්‍රී ලංකාව, මාලදිවයින, බංග්ලාදේශය, ඉන්දියාව සහ එක්සත් ජනපදය යන රටවල නියෝජනය කරමින් 40 දෙනෙකු මෙම වැඩමුළුව සඳහා සහභාගී විය. ආරක්ෂක, සිවිල් ආරක්ෂාව, සෞඛ්‍ය, පාරිසරික ආරක්ෂාව, ආපදා අවදානම් කළමනාකරණය, ගුවන්, වරාය සහ ජාත්‍යන්තර කටයුතු කාර්යාලවල නියෝජිතයන් මෙන්ම එක් එක් රටවල CBRN හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දක්වන සම්බන්ධීකරණය කරන ආයතනයන් හි විෂය පථයන් මෙහිදී සාකච්ඡාවට බඳුන්විය.



ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ ජනරාල් සහ එක්සත් ජනපද නිලධාරීන් සමඟ පැවති මූලික සාකච්ඡාව- 2024.05.21



එක්සත් ජනපද නිලධාරීන් සහ පාර්ශවකාර ආයතන නිලධාරීන් සමඟ පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.05.22



කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවති පෙර සූදානම් වැඩමුළුව- 2024.12.03-05

8.2.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය යාවත්කාලීන කිරීම

ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සහ මහජනතාව දැනුවත් කිරීම් සම්බන්ධ පූර්ව නිවේදන සහ තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළ වෙබ් අඩවිය සහ නිළ සමාජ මාධ්‍ය ජාල හරහා සිදු කෙරේ. ආපදා අවදානම් නිවේදන මහජනතාව වෙත යොමු කිරීම වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළ වෙබ් අඩවි යාවත්කාලීන කිරීම දැනුවත් කිරීමේ අංශය යටතේ පවතින මාධ්‍ය ඒකකය විසින් සිදු කරනු ලැබීය.

මේ අනුව 2024 වර්ෂය පුරාවට නියඟය, අධික වර්ෂාව, ගංවතුර, නායයාම් පිළිබඳ හදිසි අවදානම් නිවේදන, ආපදා අවදානම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද ප්‍රකාශන සහ අධ්‍යාපන මෙවලම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළ වෙබ් අඩවිය තුළ යාවත්කාලීන කිරීම සහ සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් ඇති වූ අයහපත් කාලගුණික තත්ත්ව යටතේ අප රට මුහුණ දුන් ආපදා හදිසි ආපදාවල දී දත්ත සහ තොරතුරු ක්ෂණිකව මාධ්‍ය වෙත ලබාදීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම, ජාතික සහ ජාත්‍යන්තර ආයතන දැනුවත් කිරීම සඳහා අවශ්‍ය දත්ත යාවත්කාලීන කිරීම මෙන්ම ආපදා අවස්ථාවල දී පවතින අවදානම සහ අවදානම කළමනාකරණය කර ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීමට මාධ්‍ය ආයතන විකාශනය කරනු ලැබූ වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබාදීම, සම්පත් දායකයින් සම්බන්ධීකරණය කරදීම 2024 වර්ෂය තුළ දී මාධ්‍ය ඒකකය විසින් සිදු කරනු ලැබීය.



ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන වෙබ් අඩවිය

8.2.6 ජාතික සුරක්ෂිත දින වැඩසටහන

<u>සර්ව ආගමික වැඩසටහන්</u>

2005 අංක 15/1975/715/001-1 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව 2005 වර්ෂයේ සිට සෑම වර්ෂයකම දෙසැම්බර් මස 26 වන දින "**ජාතික සුරක්ෂිත දිනය**" ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර එදින සුනාමි ව්‍යසනයෙන් සහ එදා මෙදා තුර විවිධ ආපදා නිසා රටේ මිය ගිය සියළුදෙනා සිහිපත් කරමින් 2005 වසරේ සිට අඛණ්ඩව ජාතික සුරක්ෂිත දිනය සැමරුමට සමගාමීව වැඩසටහන් සිදුකරනු ලබයි.

ඒ අනුව 2024 වර්ෂයේ දෙසැම්බර් මස 26 වන දින 20 වන "ජාතික සුරක්ෂිත දිනය" ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් දිවයින පුරා පැවැත්වීමට කටයුතු සංවිධානය කල අතර එහි ප්‍රධාන සැමරුම් උත්සවය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ දී ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා, ආරක්ෂක ලේකම්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, අමාත්‍යාංශ අතිරේක ලේකම්, ඇතුලු රාජ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් යුතුව සිදු කරන ලදි.





ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ පැවති ජාතික සුරක්ෂිත දින වැඩසටහන- 2024.12.26



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- ගාල්ල දිස්ත්‍රික්කය



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- පැරැලිය සුනාමී ස්මාරකය



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- කෑගල්ල දිස්ත්‍රික්කය



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- පොලොන්නරුව දිස්ත්‍රික්කය



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය



ගරු ධීවර අමාත්‍යාතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජාතික සුරක්ෂිත දින වැඩසටහන- කිළිනොච්චි දිස්ත්‍රික්කය

<u>තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහන්</u>

2024 ජාතික සුරක්ෂිත දින සැමරීම "අනාගත පරපුර සවිබල ගැන්වීම මඟින් ආපදා ප්‍රත්‍යාස්ථතා සමාජයක් බිහිකිරීම (Empowering the next generation for a resilient future)" යන තේමාව යටතේ ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් ලේකම් පරිශ්‍රයන්හීදී, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2024.12.26 දිනයේදී දිස්ත්‍රික්ක 25 තුළදීම පැවැත්වීමට කටයුතු සිදු කරන ලදි. ඒ අනුව ජාතික සුරක්ෂිත දිනයට සමගාමීව දිස්ත්‍රික්ක 25

තුළ වැඩසටහන් 25ක් සහ ජාතික මට්ටමේ එක් වැඩසටහනක් සිදු කරමින් තරුණ තරුණියන් 1400ක් දැනුවත් කිරීමට කටයුතු සිදු කරන ලදි.




ජාතික තරුණ සේවා සභාවේ තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.12.26



තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහන - පොලොන්නරුව දිස්ත්‍රික්කය



තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහන- වව්නියාව දිස්ත්‍රික්කය

8.2.7 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

<u>රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන</u>

රටේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බනධීකරණ ඒකක හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් විවිධ ප්‍රජාවන් හට ආපදා කළමනාකරණ දැනුම ලබා දීම අඛණ්ඩව සිදු කරමින් ඇත. විශේෂයෙන් ආපදා අවදානම් සහිත ප්‍රදේශ හඳුනාගෙන ප්‍රජාව හා පාර්ශවකාර ආයතන සම්බන්ධීකරණය කරමින් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂය සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මගින් ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 182 ක් සිදු කර ඇත. මෙහිදි මහාභාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන වැඩසටහන් 129 ද මූල්‍ය ප්‍රතිපාදන යොදා නොගෙන වැඩසටහන් 53 ද සිදුකරන ලදි.

ඒ අනුව රයිම්ස් ව්‍යාපෘතියේ (RIMES Project) මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කොට්ඨාස 04ක ක්‍රියාත්මක කරන නියමු ව්‍යාපෘතිය (Pilot Project) යටතේ

මාධ්‍ය ආයතන නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් හා තාක්ෂණ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

වගුව 8.2.3 : 2024 වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද වැඩසටහන්

අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
01	මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරන ලද වැඩසටහන්	129	11489
02	ප්‍රතිපාදන රහිතව සිදු කරන ලද වැඩසටහන්	53	4403
	එකතුව	182	16892

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද වැඩසටහන් විස්තරය පහත දක්වා ඇත.

වගුව 8.2.4 : 2024 වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද දිස්ත්‍රික් වැඩසටහන්

අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
01	අම්පාර	6	299
02	අනුරාධපුරය	3	317
03	බදුල්ල	6	364
04	මඩකලපුව	5	304
05	කොළඹ	2	308
06	ගාල්ල	2	119
07	ගම්පහ	1	37
08	හම්බන්තොට	5	229
09	යාපනය	7	380
10	කළුතර	3	175
11	මහනුවර	3	227
12	කෑගල්ල	11	420
13	කිලිනොච්චිය	8	285
14	කුරුණෑගල	3	176
15	මන්නාරම	7	284
16	මාතලේ	1	67
17	මාතර	8	1929
18	මොනරාගල	10	318
19	මුලතිව්	8	265
20	නුවරඑළිය	7	304
21	පොලොන්නරුව	7	3760
22	පුත්තලම්	6	336
23	රත්නපුර	4	88
24	ත්‍රිකුණාමලය	2	218
25	වව්නියාව	4	280
	එකතුව	**129**	**11489**





කමිටු සාමාජිකයින් හට බෝට්ටු ක්‍රියාකාරීත්වය පිළිබඳව පුහුණු වැඩසටහන- 2025.03.19 (කළුතර දිස්ත්‍රික්කය)



බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවක ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.06.18 (බදුල්ල දිස්ත්‍රික්කය)



තරුණ ප්‍රජාව ප්‍රථමාධාර සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන- 2024..07.11 (සූරියවැව යොවුන් සේනාංකය)



රෝහල් කාර්ය මණ්ඩලය සඳහා පැවති ගිණි නිවාරණය පිළිබඳව වැඩසටහන-2024.06.28 (වළස්මුල්ල මූලික රෝහල)



නායයෑම් හා පස් කණ්ඩි කඩාවැටීම් පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම- 2024.10.18 (ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)



ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන-2024.07.25 (මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය)



ග්‍රාමීය කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.08.02 (කඹුරුපිටිඅය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

8.2.8 රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ස්ඵෝටන (CBRNE) උපද්‍රව සම්බන්ධව දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ වැඩසටහන

රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ස්ඵෝටන උපද්‍රව සම්බන්ධව ජාතික වැඩසටහනට සමගාමීව පාර්ශවකාර ආයතන හඳුනාගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම දිස්ත්‍රික් ලේකම්ගේ සහ විවිධ පාර්ශවකාර ආයතන නිලධාරීන් සමඟ සිදුකර එහිදී මෙම ආපදා අවදානම් අවමකරණය සඳහා ජාතික මට්ටමින් පවත්නා ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන ආදිය (SWOT Analyze) සම්බන්ධ අධ්‍යනයක් සිදුකරන ලදි. ඒ අනුව 2024 වර්ෂයේ රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ස්ඵෝටන උපද්‍රව සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ වැඩසටහන් කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ, පුත්තලම සහ මහනුවර යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරන ලදි.



CBRN ආපදා සම්බන්ධ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.12.20 (ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)



CBRN ආපදා සම්බන්ධ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.12.20 (පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)



CBRN ආපදා සම්බන්ධ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.12.19 (කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)



CBRN ආපදා සම්බන්ධ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන- 2024.12.13 (ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)

8.2.9 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත් මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත් මධ්‍යස්ථානය (පුස්තකාලය) ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන්, ආපදා කළමනාකරණ අංශයේ නිලධාරීන් හා අනෙකුත් ආයතනවල නිලධාරීන් මෙන්ම උපාධි/ පශ්චාත් උපාධි අපේක්ෂකයන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන් ඇතුළු විවිධ අධ්‍යයන කටයුතුවල නිරත පිරිස් වෙත පුවත්පත්, පොත් සහ සඟරා ආදිය පරිහරණය කිරීමට අවස්ථාව ලබා දී ඇති අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම දැනුවත් කිරීම් අංශය විසින් සිදු කරන ලබන අතර විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ට මෙන්ම ආපදා කළමනාකරණ විෂය සම්බන්ධ උනන්දුවක් දක්වන පිරිස් සඳහා දත්ත ලබා ගැනීම සඳහා Desinventar භාවිතයට අවශ්‍ය පහසුකම් ද සම්පත් මධ්‍යස්ථානය මඟින් සපයා ඇත.


8.2.10 කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්

<u>**දේශීය අරමුදල් මත ධාරිතා වර්ධන වැඩසටහන්**</u>

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ප්‍රමුඛතම කාර්යයක් වේ. මෙම වගකීම නිවැරදිව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට නම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය ක්‍රමානුකූලව, විද්‍යාත්මක තාක්ෂණය ද භාවිතා කරමින් නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වේ. දේශීය අරමුදල් මත ධාරිතා වර්ධන වැඩසටහන් දැනුවත් කිරීමේ අංශයේ 02-2201 (i) /ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටියට අදාළ කඩඉම් පරීක්ෂණ /02/2018 අංක දරණ 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනය /18/2020 අංක දරණ 2020.10.16 දිනැති භාෂා ප්‍රවීණතා චක්‍ර ලේඛනය ආදියට අනුකූලව සකසා ඇත.

ඒ අනුව විෂය සමගාමී වැඩසටහන් 13ක් සඳහා නිලධාරීන් 58 දෙනෙක්ද කණ්ඩායම් ධාරිතා වර්ධනය වැඩසටහන් 03ක් සඳහා නිලධාරීන් 208ක් ද වශයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවා ඇත. මීට අමතරව ජාතික මට්ටමේ වැඩසටහන් 03ක් සිදුකරන ලද අතර මේ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හි


නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, සහකාර අධ්‍යක්ෂවරු සහ දිස්ත්‍රික් කළමනාකරණ සහකාර නිලධාරීන් 75ක් දෙනෙකු සහභාගි වන ලදි. මීට අමතරව ඩිප්ලෝමා වැඩසටහනක් සඳහා එක් නිලධාරියෙකුට පමණක් මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලද අතර ඊට අදාළ විස්තරය පහත දක්වා ඇත.



සටහන 8.2.2: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල ධාරිතා වර්ධනය කිරීම **2025**

8.2.11 විදේශීය ධාරිතා වර්ධන වැඩසටහන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින්ගේ ධාරිතා වර්ධනය අරමුණු කර ගනිමින්, සහකාර අධ්‍යක්ෂවරුන් 04ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු 07ක් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුයුක්ත ත්‍රිවිධ හමුදා නිලධාරීන් 03 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත. එසේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ රැස්වීම් සඳහා 04ක් අධ්‍යක්ෂ ජනරාල්තුමා ද, 06ක් සඳහා අධ්‍යක්ෂවරුන් ද සහභාගී වී ඇත. ඒ පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.



සටහන 8.2.3: වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින්ගේ ධාරිතා වර්ධනය විදේශ පුහුණු වැඩසටහන් (2024)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් විදේශ පුහුණු වැඩසටහන්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු/ සාකච්ඡා සඳහා තෝරා ගැනීමේදී අනුගමනය කල යුතු මාර්ගෝපදේශය, අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැකිය සඳහා ඉදිරිපත් කළ අතර, IMC Paper No – 06/04/2024 යටතේ එම මාර්ගෝපදේශය සඳහා අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබී ඇත.

8.3 හදිසි මෙහෙයුම් අංශය (Emergency Operations Division)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානතම අංශයක් වන හදිසි මෙහෙයුම් අංශය, පැය 24 x 7 පුරා ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව තුළ සිදු වන ආපදාවන්වලදී සිදුවන ජීවිත, දේපල සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් හා හදිසි ප්‍රතිචාර දැක්වීම සිදු කරයි. හදිසි මෙහෙයුම් මැදිරිය 24 x 7 ක්‍රියාත්මක වේ. ආපදාවන්ගෙන් සිදු විය හැකි බලපෑම තක්සේරු කර, ඒ අනුව සිදුවිය හැකි ආපදාවන්ට පූර්ව අනතුරු ඇඟවීම් ඇතුළු අදාළ සියලු ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදුකර අනතුරුවලින් ජීවිත හා දේපළ බේරා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණයත්, අනතුරක් සිදු වන අවස්ථාවේදීත් ඉන් පසුවත් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්ෂණික ප්‍රතිචාර දැක්වීම, මුදවා ගැනීම හා බේරා ගැනීම සඳහා අවශ්‍ය ආයතනික සම්බන්ධීකරණයන් සිදු කිරීම මෙම අංශයේ මූලික වගකීම වන අතර, ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණ ගැනීමත්, එමඟින් ඉදිරියේදී මුහුණදීමට සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමට කටයුතු සැලසුම් කර විවිධ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේද භාවිතා කරමින් ජනතාව හා අදාළ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරයි.

සිදුවිය හැකි ආපදා සඳහා ප්‍රතිචාර දක්වන්නන් හා අනෙකුත් පාර්ශවකාර ආයතන සමඟ හා ප්‍රජාවන් සමඟ සම්බන්ධීකරණය වී ආපදාවෙන් ජීවිත බේරාගැනීමේ මූලික අරමුණින් යුතුව කටයුතු සැලසුම් කිරීම හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදු කරයි. හදිසි මෙහෙයුම් අංශයට අදාළව ස්ථාපිත 117 හදිසි ඇමතුම් මැදිරිය හරහා සියලු ප්‍රජාවන්ට අවශ්‍ය ආපදාවන්ට අදාළ ක්ෂණික තොරතුරු අඛණ්ඩව ලබා දීම සිදු කරනු ලබයි.



හදිසි මෙහෙයුම් මැදිරිය

8.3.1 ආපදා සාරාංශය - 2024

වගුව **8.3.1:** 2024 වසරේ සිදු වූ ආපදා සාරාංශය

ආපදාව	සිදුවීම් ගණන	මරණ සංඛ්‍යාව	තුවාල වූවන්	අතුරුදහන් වීම්	පීඩාවට පත් පුද්ගල සංඛ්‍යාව	පීඩාවට පත් පවුල් සංඛ්‍යාව	පූර්ණ නිවාස හානි	අර්ධ නිවාස හානි
ගිනි ගැනීම්	24	2	0	0	286	51	3	45
ගං වතුර	386	28	13	1	807,565	206,952	62	3,509
නාය යෑම්	43	1	0	0	5,019	1,450	13	100
කණ්ඩි කඩාවැටීම	196	3	17	0	10,978	2,758	9	1,810
අකුණු ගැසීම්	143	7	4	0	3,899	1,039	0	304
දැඩි සුළං	785	6	16	4	50,084	13,306	20	5,034
මුළු එකතුව	1577	47	50	5	877,831	225,556	107	10,802

(මූලාශ්‍රය - හදිසි මෙහෙයුම් මැදිරියේ තත්ත්ව වාර්තා හා Desinventar දත්ත මත පදනම්ව)

8.3.2 ප්‍රධාන ආපදා කිහිපයක 2023 සහ 2024 වර්ෂවල සාරාංශය


- **ගංවතුර**

වගුව **8.3.2:** ගංවතුර නිසා පීඩාවට පත් වූ පුද්ගල හා පවුල් සංඛ්‍යාව 2023 - 2024

වර්ෂය	ගංවතුර නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	ගංවතුර නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2023	202,117	55,750
2024	807,565	206,952

(මූලාශ්‍රය - හදිසි මෙහෙයුම් මැදිරියේ තත්ත්ව වාර්තා හා Desinventar දත්ත මත පදනම්ව)

❖ මෙම වර්ෂයට අදාළ ගංවතුර අවදානම් හා ගංවතුර තත්වයන් යන දෙකෙහිම අදාළ දත්තයන්ගේ එකතුවක් ලෙස ගෙන ඇත.



සටහන 8.3.1: ගංවතුර නිසා පීඩාවට පත් වූ පුද්ගල හා පවුල් සංඛ්‍යාව 2023 - 2024


- **නායයෑම්**

වගුව 8.3.3: නායයෑම් නිසා පීඩාවට පත් වූ පුද්ගල හා පවුල් සංඛ්‍යාව 2023 - 2024

වර්ෂය	නායයෑම් නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	නායයෑම් නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2023	7,890	2,196
2024	5,019	1,450

(මූලාශ්‍රය - භදිසි මෙහෙයුම් මැදිරියේ තත්ත්ව වාර්තා හා Desinventar දත්ත මත පදනම්ව)

මෙම වර්ෂයට අදාළ නායයෑම් අවදානම් හා නායයෑම් තත්වයන් යන දෙකෙහිම අදාළ දත්තයන්ගේ එකතුවක් ලෙස ගෙන ඇත.




සටහන 8.3.2: නායයෑම් නිසා පීඩාවට පත් වූ පුද්ගල හා පවුල් සංඛ්‍යාව 2023 - 2024

- **ප්‍රභල / දැඩි සුළං**

වගුව 8.3.4: ප්‍රභල / දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පුද්ගල හා පවුල් සංඛ්‍යාව 2023 - 2024

වර්ෂය	දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පුද්ගල සංඛ්‍යාව	දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව
2023	25,382	6,862
2024	50,084	13,306

(මූලාශ්‍රය - භදිසි මෙහෙයුම් මැදිරියේ තත්ත්ව වාර්තා හා Desinventar දත්ත මත පදනම්ව)



සටහන 8.3.3: දැඩි සුළං නිසා පීඩාවට පත් වූ පුද්ගල හා පවුල් සංඛ්‍යාව 2022 - 2023

8.3.3 හදිසි මෙහෙයුම් අංශය හා ත්‍රිවිධ හමුදා සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සම්බන්ධීකරණයෙන් සිදු කරන ලද කටයුතු

- සාමාන්‍ය පෙළ විභාගය 2024 මැයි මස 06 වන දින සිට මැයි මස 15 වන දින දක්වා පවත්වන ලද අතර ශිෂ්‍යත්ව විභාගය සැප්තැම්බර් මස 15 වන දින පවත්වන ලදී. මෙම විභාග කාලසීමාවන් තුළ නිරිත දිග මෝසම සක්‍රීයව පැවතින. එලෙසම උසස් පෙළ විභාගය 2024 නොවැම්බර් මස 25 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා පවත්වන ලදී. මෙම විභාග කාලසීමාවන් තුළ ෙෙන්ගල් සුළි කුණාටුව සක්‍රීයව පැවති කාලසීමාවක් බැවින් සිදුවූ ආපදාවලින් බාධාවකින් තොරව සිසු සිසුවියන්ට විභාගයන්ට සහභාගී වීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා සම්බන්ධීකරණ කටයුතු පැය 24×7 ක්‍රියාත්මක හදිසි මෙහෙයුම් මැදිරියේ එක් එක් දිස්ත්‍රික්වල පිහිටි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක (DDMCU) සමඟ ක්‍රියාත්මක වීමත්, හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් තුළින් සිදු කරන ලදී. (උදා: ෙෙන්ගල් සුලිකුණාටුවෙන් බලපෑමට ලක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ සිසුන් සුරක්ෂිතව විභාග මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කිරීම, විභාග මධ්‍යස්ථානයක් වෙත විභාග ප්‍රශ්න පත්‍ර ප්‍රවාහනය කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.)
- 2024 සැප්තැම්බර් මස 21 දින පැවති ජනාධිපතිවරණයට සමගාමීව JEEOps (Joint Election Emergencies Operation Unit) විශේෂ මැතිවරණ මෙහෙයුම් මැදිරියක් සැප්තැම්බර් මස 19 දින සිට 23 දක්වා ක්‍රියාත්මක කරන ලදී. 2024 නොවැම්බර් මස 14 දින පැවති මහමැතිවරණයට සමගාමීව JEEOps (Joint Election Emergencies Operation Unit) විශේෂ මහමැතිවරණ මෙහෙයුම් මැදිරියක් නොවැම්බර් මස 12 දින සිට 16 දක්වා ක්‍රියාත්මක කරන ලදී. ජනාධිපතිවරණය හා මහමැතිවරණය පැවැති කාලසීමාවන් තුළ නිරිත දිග මෝසම් සක්‍රීයව පැවති කාලසීමාවක් බැවින්

සිදුවූ ආපදාවලින් බාධාවකින් තොරව ජනතාවට මැතිවරණයන් සඳහා සහභාගී වීමට අවශ්‍ය කටුයුතු සලසා දෙමින් හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

- නිරිත දිග මෝසමට අදාළව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ත්‍රිවිධ හමුදා සහ පොලිසිය සම්බන්ධීකරණයෙන් හදිසි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර, අනෙකුත් පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඔවුනට අවශ්‍යය සහයෝගය ලබා දීම සඳහා කටයුතු සිදු කරන ලදී.
- 24x 7 පුරා ක්‍රියාත්මක හදිසි මෙහෙයුම් මැදිරිය හරහා ආපදා සම්බන්ධ තාක්ෂණික ආයතන සම්බන්ධීකරණය සිදු කරමින් පූර්ව අනතුරු ඇඟවීම් නිවේදන හා කාලගුණික නිවේදන මහජනතාව හා ගොදුරුවීමට අවකාශ ඇති ප්‍රජාවන් සඳහා නිකුත් කරමින් ජනතාව දැනුවත් කිරීම.

වගුව 8.3.5: නිකුත් කරඇති නිවේදන

නිවේදන	**නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව**
කාලගුණික නිවේදන	1,074
විශේෂ කාලගුණික නිවේදන	382
නායයෑම් අනතුරු ඇඟවීම් පිළිබඳ නිවේදන	114
ජල මට්ටම් හා ගංවතුර අවධානම් පිළිබඳ නිවේදන	392
එකතුව	**1,962**

- වර්ෂය පුරා සිදු වූ නායයෑම්, ගංවතුර, සුළි සුළං හා කැලෑ ගිනි ආදී ආපදා තත්වයන්ට අවශ්‍ය පූර්ව අනතුරු නිවේදන නිකුත් කිරීම් හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු 24x7 පුරා සිදු කරමින් ගොදුරුවීමට ලක්වූ පිරිස් බේරා ගැනීම, මුදවා ගැනීම හා ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම මඟින් ජනතාවගේ සුරක්ෂිතභාවය තහවුරු කරන ලදී. උදාහරණ ලෙස,
  - අම්පාර දිස්ත්‍රික්කයේ ට්‍රැක්ටර් රථයක් පෙරලී යාමෙන් අනතරට පක් වූ පිරිස් මුදවා ගැනීමට ත්‍රිවිධ හමුදාව හා සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම.
  - මැයි හා ජූනි මස ඇතිවූ නිරිත දිග මෝසම් තත්වය හේතුවෙන් ඇතිවූ ගං වතුර, නාය යෑම් මඟින් සිදුවූ ආපදා තත්වයන් ක්ෂණික ප්‍රතිචාර දැක්වීමත් මුදවා ගැනීම් කටයුතු සඳහා ත්‍රිවිධ හමුදාව හා සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම.






8.3.4 CResMPA ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

CResMPA ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකු නියෝජිතයින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව සැලසුම් කිරීමේ සාකච්ඡාවන් ගණනාවක් 2024 වර්ෂයේදී පැවැත්විණි. මෙහිදී දේශගුණික ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රධාන අරමුණු 02ක් යටතේ ක්‍රියාත්මකව ඇත. එනම්,

- හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC), දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහ සම්බන්ධීකරණ ඒකක 25 (DDMCU), 117 ඇමතුම් මැදිරිය වැඩි දියුණු කිරීම හා සන්නිවේදන ජාලය සහ පූර්ව අනතුරු ඇඟවීම් යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම. මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 03ක් වෙන්කර ඇත. මේ වන විට එම වැඩසටහනේ සැලසුම් සැකසීම සඳහා උපදේශන ආයතනයක් (Consultancy Firm) තෝරා පත් කර ගෙන එහි කටයුතු සිදු කරගෙන යමින් පවතී. තවද මේ යටතේ පහත සඳහන් භාණ්ඩ මිලදී ගෙන ආපදා කළමනාකරණ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට කටයුතු සිදු කරන ලදී.

වගුව 8.3.6: CResMPA ව්‍යාපෘතිය සඳහා මිලට ගෙන ඇති භාණ්ඩ

අයිතමය (Equipment)	ප්‍රමාණය (No of Units)
අධි බලැති නැවත ආරෝපනය කළ හැකි පන්දම් (අමතර බැටරිය සමඟ) (High Power Rechargeable Torch - With extra battery)	75
ජෙනරේටර් 5KW(5KW Generator)	25
මැනිලා ලණු (අඩි 200) (Manila rope -200ft)	50
සෙවුම් පහන් (Emergency lights)	125

- ආපදා කළමනාකරණ අවම කිරීම, පෙර සූදානම් කිරීම, ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා (Decision Support System-DSS) Application Programmatic Interface (API) පද්ධතියක් නිර්මාණය කිරීම. මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1.5 ක මුදලක් වෙන් කරමින් උපදේශන ආයතනයක් (Consultancy Firm) තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

8.3.5 හදිසි මෙහෙයුම් මැදිරි නිරීක්ෂණය

විදේශීය හා දේශීය ආයතනවල නිලධාරි කණ්ඩායම් මෙම වසර තුළ හදිසි මෙහෙයුම් මැදිරිය හා 117 ඇමතුම් මැදිරියේ ක්‍රියාතාරීත්වය නැරඹීම හා හදිසි ආපදා සම්බන්ධීකරණ කටයුතු අධ්‍යනය කිරීමට පැමිණ ඇති අතර එම නිලධාරීන් සඳහා හදිසි මෙහෙයුම් මැදිරිය විසින් අවශ්‍යය දැනුවත් කිරීම් කටයුතු සිදු කරන ලදී.

8.3.6 පූර්ව දැනුම්දීම්

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ව දැනුම් දීමේ පද්ධතිය හරහා පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77ක්, 2009 වසරේ ස්ථාපිත කරන ලද අතර එය 2015 වසරේදී අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. තවද මෙම කුළුණු ක්‍රියා කරවීම සඳහා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් පුහුණු කොට හදිසි අවස්ථාවලදී ක්‍රියා කරවීමට සූදානම් කොට ඇත. එයට අමතරව කෙටි පණිවුඩ (SMS),Cell Broad cast ක්‍රමවේදය, HF/VHF ඇතුළු ක්‍රමවේද රැසක් ස්ථාපනය කොට බිම් මට්ටම දක්වා සම්බන්ධ කොට ඇත. ආපදා තොරතුරු ආපදාවන්ට පෙර, ආපදා අතරතුර දී සහ ආපදාවන්ට පසුව යන ක්‍රමවේදවලට අනුගතව පැය 24 ×7 තුළ දැනුම් දෙනු ලබයි.
- පෘතුවියේ සිදු වන භූමි කම්පා පිළිබඳව නිරීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
  ඉන්දු ඕස්ට්‍රේලියානු භූ කාරක තැටියේ පමණක් නොව පෘතුවියට අයත් සියළුම භූ කාරක තැටි තුළ හටගන්නා භූමි කම්පා පිළිබඳ තොරතුරු **USGS** මගින් ලබා ගෙන එම තොරතුරු මත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා පතල් හා කැණීම් කාර්යයාංශය **(GSMB)** සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් එම තොරතුරු අනුව භූමි කම්පා ඇති වූ විට ඒවා පිළිබඳ අදාළ දිස්ත්‍රික්කයන්හි ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සහ අනෙකුත් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම හා අවශ්‍ය මහපෙන්වීම සිදු කර සුනාමි ඇති වීමට ඇති ඉඩකඩ පිළිබඳව දැනුවත් කිරීම සිදු කරනු ලබයි.
- ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සතු VHF/HF/UHF සන්නිවේදන ජාලයන් හරහා ජනතාවට පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය නිරන්තර යාවත්කාලීන කිරීම කරනු ලබන අතර ඒ හරහා බිම් මට්ටමින් ජනතාව ඉතා කෙටි කාලයකින් දැනුවත් කිරීම සිදු කරනු ලබයි.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තොරතුරු නිලධාරියා හරහා (Information Officer) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට තොරතුරු දැන ගැනීමේ පනතට ප්‍රකාරව ලැබෙන සියළු ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වන ලදී.
- පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණුවල නඩත්තු කටයුතු මනාව පවත්වාගෙන යාම, දෛනික පරීක්ෂා කිරීම් කටයුතු සහ අධීක්ෂණ කටයුතු නිසි ලෙස සිදු කරන ලදී. මෙය සන්නිවේදන අංශය සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි.
- DEWN පද්ධතියේ ග්‍රාහකයන් ප්‍රමාණය 35,000 දක්වා වැඩි කිරීමට කටයුතු කළ අතර නව DEWN පද්ධතිය හඳුන්වා දීම සහ නිලධාරීන් ඒ පිළිබඳ පුහුණු කිරීම සිදු කරන ලදී. එමෙන්ම සුනාමි අවධානමට ලක් විය හැකි වෙරළබඩ දිස්ත්‍රික්කයන් 14 කේන්ද්‍ර කර ගනිමින් එම දිස්ත්‍රික්කයන්හි කේන්ද්‍රීය නිලධාරීන්ගේ දුරකථන අංක සහ දැඩි අවධානමට ලක් විය හැකි පුද්ගලයින්ගේ දුරකථන

අංක DEWN පද්ධතිය හා සම්බන්ධ කිරීමට කටයුතු කරන ලදී. සියළුම මාධ්‍ය හරහා පැය 24×7 තුළ පූර්ව අනතුරු ඇඟවීම් පතුරුවා හැරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරනු ලබන අතර SMS සහ අනෙකුත් ක්‍රමවේද හරහාද බලපෑමකට ලක් විය හැකි ජනතාව වෙතද අනතුරු ඇඟවීම් ලබා දී ඇත. තවද සියළුම ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් DEWN,SMS පද්ධතිය හා සම්බන්ධ කරන ලදී.

- හදිසි මෙහෙයුම් මැදිරිය පුළුල් කිරීමත් සමඟ සියළු ස්වයංක්‍රිය පද්ධතීන් (USGS, Ventusky , Windy, Automated Rain Gauges Systems-NBRO, MET & Irrigation, Online Reservoirs System, Online River Status System, PRISM, Local and International TV channels) යාවත්කාලීන කිරීම සහ සම්බන්ධ කිරීමේ කටයුතු සිදු කිරීම.
- **MOBILIZE** දත්ත පද්ධතිය හදිසි මෙහෙයුම් මැදිරිය තුළ ස්ථාපිත කොට හදිසි අවස්ථාන්හිදී සිතියම් ඇතුළු සජීවී පරිමාණයන් ගැනීමට කටයුතු සිදු කරන ලදී.
- කුඩා හා මධ්‍ය ව්‍යාපාරික ප්‍රජාවේ පණිවුඩ බෙදා හැරීමේ හැකියාව ඇති ප්‍රජාවන් **DEWN** දත්ත පද්ධතිය සමඟ ඒකාබද්ධ කොට යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර සිවිල් ආරක්ෂක බලකායේ දිස්ත්‍රික් මට්ටම් නිලධාරීන් **DEWN** දත්ත පද්ධතිය හරහා යා කොට යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

8.3.7 ඇමතුම් මැදිරිය

<u>117 ඇමතුම් මැදිරියේ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම</u>

පැය 24 × 7 ක්‍රියාක්මක මෙම අංශය මඟින් ආපදාවට ලක්ව ඇති ජනතාවගෙන් ලැබෙන ඇමතුම්වලට ප්‍රතිදාර දැකිවීම, අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, හා ආපදා සම්බන්ධ තොරතුරු හා කාලගුණික තොරතුරු අවශ්‍ය පාර්ශවයන්ට ලබා දීම මෙම අංශය මඟින් සිදු කරනු ලබන ප්‍රධානතම කාර්යකි. මෙමඟින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීවරුන්, සහන සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ගේ දුරකථන අංක යාවත්කාලීන කිරීම සහ ගංවතුර සහ නායයෑම් වලින් බලපෑමට ලක් වන දිස්ත්‍රික්ක ආපදාවට අදාලව ප්‍රතිචාර දක්වන තාක්ෂණික ආයතනවල සියළු නිලධාරීන්ගේ දුරකථන අංක ක්ෂණිකව ලබා ගත හැකි ආකාරයට දත්ත ගබඩාවක් සකස් කරන ලදී. 2024 වර්ෂය තුළ සමස්ථයක් ලෙස දුරකතන ඇමතුම් 254,397 ක් ද ඇමතුම් මැදිරිය වෙත ලැබී ඇත.



117 ඇමතුම් මැදිරිය

වගුව **8.3.6:** ඇමතුම් වාර්තාව 2023.01.01 සිට 2023.12.31

ඇමතුම් වාර්තාව **(2024.01.01 සිට 2024.12.31)**				
අනු අංකය	**මාසය**	**ආපදා සම්බන්ධ දුරකථන ඇමතුම්**	**සාමාන්‍ය තොරතුරු**	**ලැබුණු මුළු ඇමතුම් ගණන**
1	ජනවාරි	37	16,434	16,471
2	පෙබරවාරී	7	16,023	16,030
3	මාර්තු	221	20,022	20,243
4	අප්‍රේල්	12	16,867	16,879
5	මැයි	90	18,902	18,992
6	ජූනි	214	33,532	33,746
7	ජූලි	35	18,230	18,265
8	අගෝස්තු	28	21,169	21,197
9	සැප්තැම්බර්	31	28,950	28,981
10	ඔක්තොම්බර්	117	22,476	22,593
11	නොවැම්බර්	237	21,841	22,078
12	දෙසැම්බර්	13	18,909	18,922
මුළු එකතුව		**1,042**	**253,355**	**254,397**

8.3.8 ප්‍රසම්පාදන

<u>2024 හදිසි මෙහෙයුම් අංශය සඳහා වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන</u>

2024 වර්ෂයට මහා භාණ්ඩාගාරයෙන් හදිසි මෙහෙයුම් අංශය සඳහා වෙන් වූ මුදල රු.මිලියන 10කි. එම ප්‍රතිපාදන මඟින් පහත සඳහන් හදිසි ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

වගුව **8.3.7:** හදිසි මෙහෙයුම් ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලට ගැනීම

අනු අංකය	**උපකරණය**	**ප්‍රමාණය**
1	Catamaran	5
2	Mega Phone	25
3	Search Light	55
4	Throwing Bag	250
5	Manila Rope -100m	4
6	Rescue Rope-210m	2
7	Stock Handling Inventory Software	1

8.4 අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

8.4.1 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යය වන අතර එහිදී මහා භාණ්ඩාගාරය මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන කළමනාකරණය කරමින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනාවල ප්‍රමුඛතා ගතකිරීම් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. දිස්ත්‍රික්කය තුළ සිදුවන ආපදා සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශය මත දිස්ත්‍රික් මට්ටමින් යොමු කරනු ලබන ව්‍යාපෘති යෝජනා අතුරින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන කමිටුවක් මඟින්,

01. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉදිරිපත් කොට ඇති ප්‍රමුඛතාව.

02. ව්‍යාපෘතිය මඟින් සෘජුව හා වක්‍රව ප්‍රතිලාභ ලබන පවුල්/පුද්ගල ප්‍රමාණය.

03. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ජීවනෝපාය, දෛනික ජන ජීවිතයට සිදුවන බලපෑම, සැපයුම් ජාලය පවත්වා ගෙන යාමට ව්‍යාපෘතියෙන් සිදුවන බලපෑම, ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමට ව්‍යාපෘතියෙන් සිදුවන බලපෑම, දුප්පත්කම දුරලීමට වන බලපෑම, මහජනතාවගේ විරෝධය, දේශපාලනිකව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලබාගත හැකි සහාය, යන නිර්ණායක සලකා බලා ව්‍යාපෘති තෝරා ගැනීම සිදු කරනු ලබයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත අවම කිරීමේ ව්‍යාපෘති සඳහා වෙන් වූ ප්‍රතිපාදන ආපදා කළමනාකරණ අංශය මඟින් දිස්ත්‍රික් ලේකම්වරු වෙත නිදහස් කිරීම සිදු කරනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හි සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබයි.

ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති වගකීම් ප්‍රකාරව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක විසින් අනුගමනය කල යුතු මූලික ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පොදු උපදෙස් මාලාවක් ලබා දී ඇත. ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල ප්‍රගතිය සෑම මසකම 05 වන දිනට පෙර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ලබා දී ඇති ආකෘතිය අනුව සකස් කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා කරනු ලැබේ.

ව්‍යාපෘතිය අවසන් කල පසුව විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකල බවට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂක මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් රු.මිලියන 200ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. එම ප්‍රතිපාදන තුළින් රුපියල් මිලියන 25ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් අමාත්‍යාංශ ගොඩනැඟිල්ල නවීකරණය සඳහා වෙන් කර ගන්නා ලදි. 2023 වර්ෂයේ සිට අඛණ්ඩව 2024 වර්ෂයේදී ද ක්‍රියාත්මක (අවිච්ඡේද වන) වන මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් සඳහා ඉන් රුපියල් මිලියන 28.96 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමක් ද පෙර සඳහන් කරන ලද පූර්ණ ප්‍රතිපාදනය තුළින්ම සිදු විය.

2024 වර්ෂයේදී වෙන් වූ ප්‍රතිපාදන තුළින් අවම කිරීමේ ව්‍යාපෘති 38ක් සම්පූර්ණ කරන ලද අතර රත්නපුර, කළුතර හා මොනරාගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 03 ක් 2025 වර්ෂය සඳහා අවිච්ඡේද කිරීමට හා පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ එක් ව්‍යාපෘතියක් අවලංගු කිරීමට සිදු විය. ඒ අනුව 2024 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අවම කිරීමේ ව්‍යාපෘති යටතේ උක්ත ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළව රු. 157,186,214.75ක මූල්‍ය ප්‍රගතියක් සහ 90% ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගෙන ඇත.



ආබාධිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පස් බැම්ම ඉදිකිරීම - ගාල්ල දිස්ත්‍රික්කය



බදුල්ල දිස්ත්‍රික්කයේ ගලහගම ග්‍රාම නිලධාරී වසමේ කපුකොටුව මාර්ගයේ කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීම


2024 වර්ෂයේදී වෙන් වූ රු. මිලියන 200 ප්‍රතිපාදන තුළින් පුද්ගලයින් 540, 000කට පමණ සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ බැවින් වැඩි පුද්ගලයින් සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසීමට අවස්ථාව ලැබී ඇත. එමෙන්ම 2025 වර්ෂය සඳහා වෙන් වන ප්‍රතිපාදන මත අවම කිරීමේ ව්‍යාපෘති යටතේ වැඩි පුද්ගලයින් සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසීමට බලාපොරොත්තු වේ.


8.4.2 ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම - නාගරික සංවර්ධනය ක්ෂේත්‍රය

නාගරික සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ඒ තුළට ආපදා කළමනාකරණය කෙසේ ඇතුළත් විය යුතුද, ආපදා අවම වන ආකාරයට නාගරික සංවර්ධන සඳහා පවතින නීති රීති, අණපනත්, සැලසුම් සකස් කල යුතුද යන්න පිළිබඳව මාර්ගෝපදේශ සැකසීම මේ මඟින් බලාපොරොත්තු වේ.

මෙමඟින් නාගරික සංවර්ධනයේදී සිදු වන ආපදා අවම කර ගැනීමට හැකියාව ලැබෙන බැවින් තිරසර සංවර්ධන සභාව මඟින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන ඉලක්ක 17 (Sustainable Development Goals) හි 11 වන ඉලක්කය වන " තිරසර නගර සහ ප්‍රජාවන් " යන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා ඉවහල් වනු ඇත.

මේ සඳහා 2024.08.28 වන දින නාගරික සැලසුම් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රැස්වීම් ශාලාවේදී වැඩමුළුවක් පවත්වන ලදි. ඒ සඳහා නාගරික සැලසුම් නිලධාරීන් 33 ක් නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශ නියෝජනය කරමින් පැමිණි අතර ඒ අනුව කෙටුම්පත් කරන ලද මාර්ගෝපදේශය නැවත විශ්ලේෂණාත්මකව පරීක්ෂා කොට බලා නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාවලිය හා ආයතනික කාර්ය විෂයට අනුගත වන බවට තීරණය කරන ලදී. ඔවුන්ගේ අධීක්ෂණය අනුව එහි වැඩකටයුතු අවසන් කොට මාර්ගෝපදේශය මුද්‍රණය සඳහා ලබා දී ඇත. මාර්ගෝපදේශ මුද්‍රණය සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු 2024 දෙසැම්බර් මස 11 දින ආරම්භ කරන ලදි. ඒ අනුව 100% ක ප්‍රගතියක් අත් කරගෙන ඇත.





8.4.3 ආපදා අවදානම් තක්සේරුව

ජාතික මට්ටමින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාසල් ආපදා අවදානම් තක්සේරුවක් සිදු කිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින්ම අවස්ථා ගණනාවකදීම ඉස්මතු වූ අතර එය කාලීන අවශ්‍යතාවයක් ද විය. ඒ හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡා සිදු කිරීමෙන් අනතුරුව කලාප අධ්‍යාපන

අධ්‍යක්ෂකවරුන් සහ විදුහල්පතිවරුන් දැනුවත් කර උක්ත අවදානම් දර්ශකය සැකසීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ප්‍රශ්නාවලියක් හරහා ඒකරාශී කරන ලද අතර එම ඒකරාශි කරන ලද තොරතුරු ප්‍රධාන දත්ත පද්ධතියට ඇතුළත් කිරීම 2023 වර්ෂයේදී අවසන් කරන ලදි. ඒ අනුව පාසල් 10,157 කින් යුත් පාසල් දත්ත පද්ධතියේ මූලික තොරතුරු සියල්ල මේ වන විට සම්පූර්ණ කර තිබේ.


ගංවතුර ආපදා තත්ත්වයන්ට මුහුණු දෙනු ලබන පාසල් විභාග කටයුතු සඳහා යොදා ගෙන තිබීම හේතුවෙන් අදාළ විභාග සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ට විවිධ ගැටළු පැන නැගීම මෑත කාලයේදී දක්නට ලැබුණි. විභාග පැවැත්වීමට මෙන්ම මැතිවරණ කටයුතු පැවැත්වීම සඳහා ද පාසල් භාවිතා කරන අතර උක්ත අවදානම් දර්ශකය භාවිතය මඟින් මෙසේ ඇති විය හැකි ගැටළු අවම කර ගනිමින් විභාග කටයුතු මෙන්ම මැතිවරණ කටයුතු සැලසුම් කිරීමට හැකියාව ලැබේ.


රට තුළ තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පදනම වශයෙන් සලකනු ලබන හතර වැනි තිරසර සංවර්ධන ඉලක්කය වන “ ගුණාත්මක අධ්‍යාපනයක් ” ඇති කිරීම සඳහා පාසල් සම්බන්ධයෙන් සිදු කරන ලද මෙම දත්ත පද්ධතිය උපකාරී කර ගැනීමට හැකියාවක් ලැබේ.


2023 වර්ෂයේදී අවසන් කරන ලද පාසල් දත්ත රැස් කිරීමට අදාළව අවදානම් දර්ශකය සැකසීමේ ඉදිරි කටයුතු අදාළ කාර්යය මණ්ඩලය නොමැති වීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබූ අතර 2024 ජූලි මස මෙම අංශයේ පැවති තනතුරු පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදු වූ අතර ව්‍යාපෘතියට අදාළ කාර්යයන් නැවත ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මෙම වර්ෂයේදී එහි වැඩ කටයුතු අවසන් කොට පාසල් ආපදා අවදානම් තක්සේරුව මුද්‍රණය සඳහා ලබා දී ඇත. ඒ අනුව 100% ක ප්‍රගතියක් අත් කරගෙන ඇත.




ඒ අනුව දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි ගංවතුර, නියඟය, නායයාම්, අකුණු අනතුරු, කුණාටු, සුනාමි හා සුළං ආදි ආපදා හතක් ආවරණය වන ආකාරයට සිතියම් 147ක් මෙහිදී සකස් කර ඇත.


School Flood Risk Assessment
Legend


School Landslide Risk Assessment




School Flood Risk Assessment - Vavuniya District
School Flood Risk Assessment - Ratnapura District
School Flood Risk Assessment - Anuradhapura District
School Flood Risk Assessment - Batticaloa District
School Flood Risk Assessment - Galle District
School Flood Risk Assessment - Hambantota District
School Flood Risk Assessment - Kalutara District
School Flood Risk Assessment - Kegalle District
School Flood Risk Assessment - Kurunagala District
Assessment - Kilinochchi District
Assessment - Matara District
Assessment - Mullaitivu District

8.4.4 චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම

ආපදාවලට පෙර සුදානම් වීම සඳහා මෙන්ම හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම් සඳහා ආපදා සිදු විය හැකි සහ ආපදා සිදු වී ඇති ප්‍රදේශ මෙන්ම ආපදාවට ලක් වූ පිරිස් පිළිබඳ දත්ත ඉතාමත් වැදගත් සාධකයක් වේ. මෙම දත්ත ලබා ගැනීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් තොරතුරු අනාවරණය කිරීම අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් කටයුතු කරනු ලැබේ. මෙහිදී කාලගුණ අනාවැකි පදනම් කර ගනිමින් ආපදා ඇති වීමට පෙර සහ ආපදා ඇති වීමෙන් පසු චන්ද්‍රිකා ඡයාරූප ලබා ගෙන එම ඡායාරූප විශ්ලේෂණය මඟින් පවතින ද්විතීක දත්ත පදනම් කර ගනිමින් උක්ත තොරතුරු ලබා ගැනීමට කටයුතු කෙරේ.

ජාත්‍යාන්තර චන්ද්‍රිකා තාක්ෂණ ආයතන මඟින් මෙම ඡායාරූප ලබා ගන්නා අතර ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත විශේෂිත අවස්ථාවක් ‘‘ඉන්ටනැෂනල් චාටර්’’ (International Charter) සහ ‘‘සෙන්ටිනල් ඒශියා’’ (Sentinel Asia) යන ආයතන මඟින් ලබා දී ඇති අතර ආපදාවකට පෙර හෝ ආපදා අවස්ථාවේදී නිසි ක්‍රමවේද ඔස්සේ එම ආයතන වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ආපදා අවදානම් ප්‍රදේශ ආවරණය වන පරිදි චන්ද්‍රිකා ඡායාරූප ලබා ගැනීම සිදු කෙරෙන අතර ආපදාවට පෙර සහ පසු ඡායාරූප ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දීමට කටයුතු කෙරේ. තාක්ෂණික මෘදුකාංග භාවිතයෙන් මෙම ඡායාරූප විශ්ලේෂණය කර අදාළ ආපදා ප්‍රදේශ හඳුනා ගැනීම ඉන් අනතුරුව සිදු කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කාර්යයන් ජාත්‍යන්තර සහායද ඇතිව සිදු කරන ලදි.


- 2024.10.11 වන දින සිට මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශයට ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් කලු ගඟ, අත්තනගලු ඔය සහ කැළණි ගඟ ආශ්‍රිතව ඇති වූ ගංවතුර තත්ත්වය මත චන්ද්‍රිකා ඡායාරූප යොදා ගනිමින් විශ්ලේෂණ සිදු කරන ලදි.
- මෙම සක්‍රීය (Activation) කිරීම සමඟ චන්ද්‍රකා ඡායාරූප විශ්ලේෂණ කටයුතු සිදු කරමින් පහත දැක්වෙන ආකාරයට ගංවතුර ව්‍යාපෘති සිතියම් සකස් කරන ලදි. මෙම සක්‍රීය (Activation) කිරීමට අදාළ වැඩි විස්තර පහත දැක්වෙන වෙබ් ලින්ක් වෙත පිවිසීමෙන් ලබා ගත හැක.
- 2024.11.23 ෙන්ගල් කුණාටුව මඟින් දිස්ත්‍රික්ක 12ක් පිඩාවට පත් වීමේදී ප්‍රදේශය ආශ්‍රිතව ගංවතුරින් පීඩාවට පත්ව ඇති ප්‍රදේශය නිවැරදිව හඳුනා ගැනීම සඳහා නැවත ‘‘ඉන්ටනැෂනල් චාටර්’’ (International Charter) සහ ‘‘සෙන්ටිනල් ඒශියා ’’ (Sentinel Asia) යන ආයතන මඟින් චන්ද්‍රිකා ඡායාරූප ලබා ගනිමින් විශ්ලේශන සිදු කරන ලදි. ඒ අනුව දිස්ත්‍රික්ක 12 ක් ආවරණය වන පරිදි ගංවතුර ව්‍යාපෘති ප්‍රදේශ සිතියම් සකස් කරන ලදි. මේ පිළිබඳව වැඩි විස්තර පහත වෙබ් පිටුව වෙත පිවිසීමෙන්ද ලබා ගැනීමේ හැකියාව ඇත.

8.4.5 MODIS වන්ද්‍රිකා දත්ත භාවිතයෙන් නියඟය නිරීක්ෂණය කිරීම

MODIS ව්‍යුත්පන්න නියඟ දර්ශක මඟින් රටක හෝ ප්‍රදේශයක නියඟ තත්ත්වයන් තක්සේරු කිරීම සඳහා ප්‍රයෝජනවත් භූගෝලීය තොරතුරු සපයයි. මෙම නිර්දේශිත පිළිවෙතෙහි අරමුණ වන්නේ කාලගුණ විද්‍යාත්මක නියඟයේ ස්වාභාවික වෘක්ෂලතා ආදිය කෙරෙහි ඇති කරන බලපෑම් නිරීක්ෂණය කිරීමයි. MODIS දත්ත නොමිලේ බාගත කළ හැකි අතර සහ ප්‍රවේශ වීමට පහසුය. මෙම දත්ත විශ්ලේෂණය භාවිතා කරමින් ප්‍රදේශයක නියඟයේ ප්‍රතිශතය, නියඟයෙන් තොර ප්‍රදේශවල ප්‍රතිශතය සහ වලාකුළු ආවරණයේ ප්‍රතිශතයන් ඇස්තමේන්තු කළ හැකිය.

MODIS දත්ත සහ නිෂ්පාදන (Data & Products) සියල්ල 2000 වසරේ සිට ලබා ගත හැකිය. AppEEARS වෙබ් අඩවියට (https://lpdaacsvc.cr.usgs.gov/appeears/) පිවිස MODIS දත්ත නොමිලේ බාගත හැක.

මෙම දත්ත නියඟය පිළිබඳ තීරණ ගැනීම්, පුරෝකථන, නියං කාල සඳහා පෙර සූදානම් වීමට උපකාරී වේ. මේවන විට 2000 වර්ෂයේ සිට 2024 වර්ෂයේ දෙසැම්බර් දක්වා සිතියම් සකස් කොට ඇත.



MODIS වන්ද්‍රිකා දත්ත භාවිතයෙන් නියඟය නිරීක්ෂණය සඳහා සකසන ලද සිතියම්

8.4.6 විවිධ පාර්ශව වෙත දත්ත ලබා දීම හා සිතියම් නිර්මාණය කිරීම

2024 වර්ෂය තුළදී සබරගමුව විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT), පේරාදෙණිය විශ්ව විද්‍යාලය යන විශ්ව විද්‍යාල සිසුන් හා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සිදු කරන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අධ්‍යක්ෂක ජනරාල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබන ඉල්ලීම්වලට අදාළව දත්ත සහ සිතියම් පහත පරිදි ලබා දී ඇත.

- විදුලි බල පද්ධති විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Power System Reliability Strengthening Project) සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති හෝමාගම, පිටිපන හා මීගමුව ප්‍රදේශවල යෝජිත 132/33kv ජාලක උපපොළවල් සඳහා ගංවතුර මට්ටම පිළිබඳ සිතියම් නිර්මාණය කර ලබාදී ඇත.
- රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් ජල ගැලීම්, ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොටගෙන සේවයට නොපැමිණි නිලධාරීන් සඳහා නිවාඩු අනුමත කිරීමට අවශ්‍ය දත්ත ලබා දීම.
- පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙත ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු විවාදය සඳහා කැළණි ගංඟා ද්‍රෝණියේ ගංවතුර සිදුවීම් පිළිබඳ දත්ත ලබා දීම.
- ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ඉල්ලීමකට අනුව 2024 වසරට පෙර වසර 5 තුළ සිදුවූ ස්වභාවික ආපදා පිළිබඳ දත්ත ලබා දී ඇත.


8.4.7 Desinventar සහ RiskInfo දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම

ආපදා අවදානම් අවම කර ගැනීමට මෙන්ම නව අධ්‍යයන සඳහා නිවැරදිව යාවත්කාලීන වන දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය කරුණක් වේ.

මෙම අවශ්‍යතාවය අනුව අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය විසින් 2008 වසරේදී Desinventar දත්ත ගබඩාව පිහිටුවා විය. එහි 1974 සිට ආපදා හානි හා අහිමිවීම් පිළිබඳ දත්ත ඇතුළත් වන අතර අන්තර්ජාලය ඔස්සේ නොමිලේ සහ විවෘතව ඕනෑම අයෙකුට දත්ත ලබා ගැනීම සිදු කළ හැක. මෙම දත්ත ගබඩාවන් ආපදා කළමනාකරණය පිළිබඳ කටයුතු කරනු ලබන විවිධ ආයතන සහ පුද්ගලයින් සඳහා සහාය වීමත් පර්යේෂණ කටයුතු සඳහා දිරිමත් කිරීමත් සිදු කරනු ලබයි.


උදාහරණයක් ලෙස මෙම සේවාව නොමිලේ ලබා ගැනීමේ හැකියාවක් ඇති බැවින් උසස් අධ්‍යාපන කටයුතුවල නිරතවන විශ්ව විද්‍යාල සිසුන්, උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් ඔවුන්ගේ විවිධ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය දත්ත හා සිතියම් ලබා ගැනීමට මෙම Desinventar සහ RiskInfo දත්ත ගබඩාව යොදා ගනු ලබයි.







පහත දක්වා ඇති දත්ත රැස් කිරීම සහ යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය අනුව මෙම දත්ත පද්ධතිය සෑම දින 15කට වරක් යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ. කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් යාවත්කාලීන කිරීම ප්‍රමාද වූ නමුත් නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව 2024 වර්ෂයේ මාර්තු මස දක්වා දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන කර ඇත. මේ වන විට ඉතිරි දත්ත යාවත්කාලීන කිරීමද සිදු කරමින් පවතී.



මෙයට සමගාමීව Riskinfo අවදානම් තොරතුරු වෙබ් අඩවිය (Riskinfo Web Portal) ද නවතම දත්තයන් සහිතව යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පවතී. මෙහිදී භූ අවකාශීය දත්ත (Geospatial Data) වෙබ් අඩවියට එක් කිරීම (upload) සිදු කරන අතර මෙම භූ අවකාශීය දත්ත දෙස් විදෙස්

පර්යේෂකයින් විසින් භාවිතා කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන හා සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණ ගැනීම්, ඉදිරි සැලසුම් සැකසීම් සිදු කරනු ලබයි.

මෙහි යාවත්කාලීන කිරීමේ කටයුතුද නවක බඳවා ගැනීමත් සමඟ ක්‍රමයෙන් සිදු කෙරෙමින් පවතී.

8.4.8 දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා හා කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

ආපදා අවම කිරීමට අදාළව මහජනතාව සහ විවිධ ආයතන විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා හා කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර යොමු කර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත. මීට අමතරව විෂයභාර අමාත්‍යාංශය වන ආරක්ෂක අමාත්‍යාංශය සහ ජනාධිපති කාර්යාලය මඟින් යොමු කරනු ලබන මහජන ඉල්ලීම් සම්බන්ධයෙන් වන ලිපි සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමද සිදු කරන ලදි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පරාසය තුළ වන ඉල්ලීම් සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා අවශ්‍ය ස්ථානීය පරීක්ෂණ කිරීම් සිදු කර එම පරීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිසි ක්‍රමවේදයන් අනුව තීන්දු තීරණ ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කිරීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පරාසය තුළින් ආවරණය නොවන මහජන ඉල්ලීම් සම්බන්ධයෙන් අදාල වගකීම් දරණ ආයතනය හෝ රේඛීය අමාත්‍යාංශය වෙත සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ ඉල්ලීම් ලිපි යොමු කිරීම සිදු කරනු ලබයි. සෑම ලිපි ගනුදෙනුවකදීම ඉල්ලුම්කරු හෝ ලිපිය යොමු කරන ලද ආයතනය වෙතද (උදා- ජනාධිපති කාර්යාලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආගමික ස්ථාන) පිටපතක් යොමු කරමින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමද සිදු කරනු ලබයි. ආපදා හානි වෙනුවෙන් වන්දි ලබා ගැනීම් හා නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාස ඉල්ලුම් කිරීම් සම්බන්ධයෙන් වන මහජන ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සතුටුදායක ලෙස ප්‍රතිචාර දක්වා නොමැති බව දිගින් දිගටම ඉල්ලුම්කරු විසින් නැවත නැවතත් යොමු කරන ලිපි වලින් පෙනී යයි.

2024 වර්ෂයේ කොළඹ, මහනුවර, බදුල්ල සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන් තුළින් වැඩි මහජන ඉල්ලීම් ප්‍රමාණයක් ලැබී ඇති අතර වර්ෂය තුළ ලැබී ඇති ලිපි සඳහා ප්‍රතිචාර ලිපි 364 ක් මඟින් ලිඛිතව ප්‍රතිචාර දක්වා ඇත.

8.4.9 ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම

ආපදා අවදානම් කළමනාකරණය සඳහා වන ගෝලීය රාමුව වන සෙන්දායි ක්‍රියාකාරී සැලැස්ම (2015-2030) 2015 වර්ෂයේ ඉදිරිපත් කොට ඇති අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය කරනු ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව මෙම ක්‍රියාකාරී සැලැස්මට අනුගතව ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට එකඟව ඇත. මෙම සැලැස්ම විෂයගත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ රට තුළ

ක්‍රියාත්මක කිරීමේ වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සැලැස්ම, ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම හා ප්‍රාදේශීය ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනු ලබන අතර එක්සත් ජාතීන්ගේ ආපදා කළමනාකරණය සඳහා වන කාර්යාලයට ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණ සැලැස්මේ ප්‍රගතිය ගෝලීය නිර්නායක අනුව වාර්තා කරනු ලබයි.

මෙම කාර්යභාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යාංශ වැය ශීර්ෂය 103-1-15-002-2509 යටතේ රුපියල් මිලියන එකක ප්‍රතිපාදන 2024 වර්ෂය සඳහා වෙන් විය.

ඒ අනුව ජාතික වශයෙන් අත්‍යාවශ්‍යව සැකසිය යුතු මෙම වාර්තාව සැකසීම සඳහා සියළු පාර්ශවකාර ආයතනවල (රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික) සහභාගීත්වයෙන් දෙදින වැඩමුළුවක් 2024 දෙසැම්බර් මස 17, 18 දෙදින තුළ බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ සාර්ථකව පවත්වන ලදි.

පළමු දින ප්‍රාදේශීය සහ රාජ්‍ය ආයතන 45 ක් සහභාගි වූ අතර පසුගිය වසර පහ තුළ ඔවුන්ගේ ජයග්‍රහණ, අභියෝග සහ ආපදා අවදානම් කළමනාකරණයට අදාළ යෝජනා ඔවුන් විසින් සිදු කල ඉදිරිපත් කිරීම් මඟින් සහභාගිවන්නන් වෙත ඉදිරිපත් කරන ලදී.




2024 දෙසැම්බර් 17 දින පැවති වැඩමුළුවෙහිදී එක් එක් ආයතන විසින් ඉදිරිපත් කිරීම් සිදු කිරීම.

දෙවැනි දින රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය සහ පෞද්ගලික අංශය නියෝජනය කරමින් සහභාගී වූ නියෝජිතයන් සඳහා වැඩමුළුව පවත්වන ලදි.




2024 දෙසැම්බර් 18 දින පවත්වන ලද වැඩමුළුව

මෙම දෙදින පුහුණු වැඩමුළුව උක්ත වාර්තාව සැකසීම සඳහා වන දත්ත, තොරතුරු හා අවශ්‍ය දැනුම් හුවමාරුව සහ සහයෝගිතා වර්ධනය කිරීම සඳහා උපකාරී විය.

8.4.10 ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සි (JICA) සහය ඇතිව, කැළණි ගංගා ද්‍රෝණිය තුළ ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය යාන්ත්‍රනය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකාවේ ගංඟා ද්‍රෝණි සංවර්ධන සැලැස්ම මත පදනම්ව ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය පරිපාලන සංවර්ධන යාන්ත්‍රනය තුළට අන්තර්ග්‍රහනය කිරීම මෙහි අරමුණ විය. මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2025.06.30 අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

කැළණි ගංඟා ද්‍රෝණිය ආවරණය වන කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක් සහ ඒ හා සමපාත පළාත් පාලන ආයතන 04 ක් තෝරා ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. එමෙන්ම මේ සඳහා සියළු පාර්ශවකාර ආයතනයන්ගේ නියෝජිතයන්ගෙන් යුත් තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමක් ද පිහිටු වන ලදි.

මේ සඳහා වන පලමු වන ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව (JCC Meeting) 2021.12.01 දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදි. 2022.09.01 දින දෙවන, 2023.03.22 දින තුන්වන, 2024.05.20 දින හතරවන හා අවසාන ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව 2025.01.15 දින පවත්වන ලදි. මීට අමතරව මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී කමිටු රැස්වීම් හා පලාත් පාලන ආයතන සඳහා වැඩමුළුද පවත්වන ලදි.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේදී,

1. ගංඟා ද්‍රෝණි පුළුල් ලෙස සම්බන්ධීකරණයකට ලක් කිරීමට සහ ආපදා අවදානම් අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සහ මාර්ග සිතියමක් සකස් කිරීම.
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, පළාත් පාලන ආයතන, අනෙකුත් අදාළ ආයතන විසින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කර ගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා ආපදා අවදානම් අවම කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම.
3. කැලණි ගං ද්‍රෝණියේ ආපදා අවදානම සැලකිල්ලට ගනිමින් ආපදා අවදානම් අවම කිරීමේ උපාය මාර්ගය සකස් කර ඇත.
4. කැලණි ගංඟා ද්‍රෝණියේ නියමු ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලියට ආපදා අවදානම් අවම කිරීම අන්තර්ග්‍රහනය කිරීම.

යන කරුණුවලට අදාළව කඩුවෙල, කොලොන්නාව, කැළණිය, බියගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. එක් එක් ප්‍රධාන ක්‍රියාකාරකම් සබැඳිව 2024.12.31 වන විට 100% ක ප්‍රගතියක් අත් කරගනිමින් මෙම ව්‍යාපෘතිය අවසන් කර ඇත.

8.4.11 පසු ආපදා අවශ්‍යතා තක්සේරුව (Post Disaster Need Assessment - PDNA)

2024 වසර අවසානයේදී ෆෙන්ගල් සුළි සුළඟ හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වයන් යටතේ රට තුළ බොහෝ ප්‍රදේශ ආපදා තත්ත්වයන්ට මුහුණ දෙන ලදි. මේ හේතුවෙන් භෞතික මෙන්ම පාරිසරික හානි ද සිදු විය. අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් එයට අදාළව අහිමි වීම් සහ හානි වීම් පිළිබඳව අනෙකුත් පාර්ශවකාර රාජ්‍ය ආයතන 42ක් හා රාජ්‍ය නොවන සංවිධාන 13ක් සමඟ සම්බන්ධ වී තක්සේරුව වාර්තා කිරීම ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන මේ වන විටත් ක්‍රිකාත්මක වෙමින් පවතින අතර එය 2025 වර්ශයේ පළමු කාර්තුව අවසාන වන විට නිම කිරීමට අපේක්ෂිතය.

2024.12.17 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ මේ සඳහා මූලික වැඩසටහන පවත්වන ලදි.

8.4.12 ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

වගුව 8.4.1: ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

අ/අ	වැඩසටහන/ව්‍යාපෘතිය	ඇස්ත මේන්තු ගත මුළු පිරිවැය (රු.මී.)	2024 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන (රු.මී.)	2024.12.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මී.)		2024.12.31 දිනට භෞතික ප්‍රගතිය (%)	
				වියදම	සමුච්ඡිත වියදම	භෞතික ප්‍රගතිය	සමුච්ඡිත භෞතික ප්‍රගතිය
01	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති. (වැ.ශී.103-2-17-02-2509)	200	200	-	157.19	-	90%
02	බහු විධි ආපදා අවධානම් පැතිකඩ සංවර්ධනය කිරීම. (වැ.ශී.103-2-17-04-2509)	01	01	-	0.03	-	100%
03	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම. (වැ.ශී.103-2-17-06-2509)	01	01	-	0.31	-	100%

8.5 තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය

ආපදා කළමනාකරණ යාන්ත්‍රණයේ දී තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනය යොදා ගැනීමට අදාළව කටයුතු කිරීමේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් ඒකක තුළ දෛනික අවශ්‍යතා මෙන්ම ආපදා තත්ත්වයකට මුහුණදීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අවශ්‍යතාවයන්ට අදාළ කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව සිදු කිරීම මෙන්ම ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන් නිසි පරිදි පවත්වාගෙන යමින් මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී සේවයක් සැපයීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය විසින් සිදු කරනු ලබයි.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ඒකකයන්හි තොරතුරු හා සන්නිවේදන පද්ධතීන් පවත්වාගෙන යාම - එනම් පරිගණක පද්ධතින්, පැය 24x7 පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වන ජාලකරණ පද්ධතීන්, මෘදුකාංග හා දෘඩාංග, සන්නිවේදන ජාලයන් නිසි පරිදි පවත්වාගෙන යාම, නඩත්තු කටයුතු සිදු කිරීම සහ නව ක්‍රමවේද ඇති කිරීම වැනි කරුණු හැදින්විය හැක.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන ජාතික මට්ටමේ , දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශිය මට්ටමේ සියලු කටයුතුවලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ලෙස අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබාදීම.
- 24x7 පුරා ක්‍රියාත්මක ආපදා කළමනාකරණ සම්බන්ධයෙන් වන 117 ජාතික ඇමතුම් මැදිරියේ සහ හදිසි මෙහෙයුම් මැදිරියේ ස්ථාපිතව පවතින සියලුම තාක්ෂණ උපාංග නිරන්තර පරීක්ෂාවට ලක්කර නිසි ක්‍රියාකරී තත්වයේ පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සහ දිස්ත්‍රික් ඒකකයන් හි සියලුම කාර්ය මණ්ඩල සඳහා VPN දුරකථන සම්බන්ධතා ලබාදෙමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම මෙන්ම දුරස්ථ සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස යොදා ගනු ලබන Zoom, Team වැනි තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් දුරස්ථ සන්නිවේදන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබා දීම.
- ආපදා කළමණාකරණ යාන්ත්‍රණයේ දී පූර්ව අනතුරු ඇඟවීම් සඳහා භාවිතා කරන සන්නිවේදන පද්ධතීන් අලුත්වැඩියා කර නඩත්තු කටයුතු සිදුකිරීම සහ නව ක්‍රමවේද ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

8.5.1 ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ සන්නිවේදන ජාලය ක්‍රියාකාරී තත්වයේ පවත්වාගෙන යාම

- ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය වඩා ශක්තිමක් කිරීම තුළින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමේ අරමුණින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සියලුම දුරකථන සන්නිවේදන සේවා සපයන ආයතන, එනම් SLT Mobitel, Hutch, Dialog හා Airtel දුරකථන සේවා සැපයුම් ආයතන එක්ව, ගිවිසුම් ගතව ඕනෑම

ආපදා තත්වයකදී මහජනතාවට පූර්ව අනතුරු ඇගවිය හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ව දැනුම් දීමේ පද්ධතිය හරහා පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77ක්, 2009 වසරේ ස්ථාපිත කර ඇති මෙම කුළුණු නිසි ක්‍රියාකාරී තත්වයේ නොපවතින අතර එම කුළුණු පිළිබඳ ස්ථාන පරීක්ෂණයක් සිදු කර කුළුණු පිළිබඳ වාර්තාවක් සකසා එම සන්නිවේදන ක්‍රමවේදය වෙනුවට විකල්ප සන්නිවේදන ක්‍රමවේද හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.
- ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සතු VHF/HF/UHF සන්නිවේදන ජාලයන් හදිසි මෙහෙයුම් මැදිරිය තුළ ස්ථාපිත කර ඒ හරහා ජනතාවට පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය නිරන්තර යාවත්කාලීන කිරීම කරනු ලබන අතර එම සන්නිවේදන පද්ධති පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දීම.
